
# දළදා වරුණ

ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2558 නිකිණි මස 10 වන ඉරු දින ■ 2014 අගෝස්තු මස 10 වැනි ඉරිදා



■ තොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# බුද්ධියෙන් සිතන්න

බුද්ධිමත්ව, සංවර්ධනාත්මකව සිතන ඕනෑම කෙනෙකුට සිය ජීවිතය සාර්ථක කරගත හැකිය. සියල්ලටම මුල සිතය.

අප කරන්නේ කියන දේයි. කියන්නේ කරන දේයි. සෑම ක්‍රියාවකටම මුල් වන්නේ සිත බව ඉන් පැහැදිලිය.

පුනර්භවයක් ලැබීමට පවා මුල් වන්නේ සිත නම්, සිතිවිලිවල බලය, ශක්තිය කෙතෙක්දැයි හෙළිවෙයි.

සාර්ථක ජීවිතයක් හිමිවන්නේ සාර්ථකව සිතන්නාටයි. ඒ නිසා දිනපතාම හිමිදිරියේම අවදි වූ වහාම මෙසේ සිතන්න:

"මම මේ මොහොතේ පටන් දිනෙන් දිනම සෑම ආකාරයෙන්ම, සෑම අංශයකින්ම වඩ වඩාත් යහපත් වෙමි, උසස් වෙමි, සංවර්ධනය වෙමි.

ඊයේට වඩා අද යහපත්ය. හෙට දවස අදටත් වඩා යහපත්ය. සාර්ථකය. ඒ තත්ත්වයට පත්වීම සඳහා මම සෑම විටම සිතමි, කියමි, ක්‍රියා කරමි.

සෑම දෙයක්ම කරන්නේ මිනිසාය. සියලුම උසස් තත්ත්වයන්ට පත්වී ඇත්තේ මිනිසාය. බුදු බව පවා ලබන්නේද මිනිසෙකි.

මමද මිනිසෙක්මි.

මටද මා කැමති තත්ත්වයට පත්වීමට ශක්තිය ඇත. මගේ සිතිවිලිත්, වචනත්, ක්‍රියාවලියත් මොහොතක් පාසා ඊට සුදුසු පරිදි සකස් කර ගන්නෙමි.

මගේ නිර්මාතෘවරයා මමමය."

නින්දට පෙරද 'ඇඳේදීම එසේ සිතන්න.

සෑම අංශයකින්ම යනු කායික, මානසික, අධ්‍යාත්මික, චිත්තවේගික, ආර්ථික, සාමාජික ආදී අංශයන් බව මැනවින් වටහා ගන්න.

ඉහත කී අදහස, ප්‍රාර්ථනය, දවස පුරාම හැකි හැම මොහොතේම සිත තබාගන්න. එම කල්පනාවෙන් සිත හසුරුවන්න. කතාබහ කරන්න. ඉන් කියැවෙන අදහසට අනුව ක්‍රියා කරන්න.

නිදසුනක් ගනිමු.

ඔබ ශිෂ්‍යයකු නම් ඊයේ ලියූ අකුරුවලට වඩා ලස්සන අකුරු අද ලිවීමට උත්සාහ කරන්න. ඔබේ කතා විලාශය, තෝරා ගන්නා වචන පවා ඊයේට වඩා විධිමත්ව, අර්ථවත්ව, හරවත්ව, රසවත්ව කාරුණික ස්වරයට වෙනස් කරගන්න.

තමන් කියන, කරන සෑම දෙයක්ම මොහොතින් මොහොත සාර්ථකයි යන සිතිවිල්ල සිතට දැඩි ඉස් කා වැදීමට සලසන්න.

ක්‍රියාවට පෙරළෙන්නේ සිත තුළ දැඩිව පවත්නා සිතිවිලියි. ඒ නිසා නොකඩවාම මෙසේ සිතා ක්‍රියා කරන්නේ නම් මාසයක් තුළදී ඔබ තුළ ඇතිවන වෙනස ගැන ඔබම පුදුම වේවි.

දිනෙන් දින ඇතිවන වෙනස ගැන කල්පනාවෙන් සිටින්න. වෙනස සටහන් කරගන්න. දිනෙන් දිනම මොහොතින් මොහොතේම ඉතා ගුණවත්, යහපත්, ධෛර්ය සම්පන්න සාර්ථක ජීවිතයක් ඔබට හිමිවනවා නොඅනුමානයි.

"මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# ඔබ අප්‍රමාණ බැතියෙන් යුතුව වන්දනාමාන කරන දළදා වහන්සේ ගැනත් පෙරහර ගැනත්

## මේ තොරතුරු දැන සිටියාද?

බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා පිළිබඳ විස්තර සොයා යෑමේදී හෙළිදරව් කරගත හැකි වන්නේ අල්ප වූ තොරතුරුය. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ පිළිබඳ ඉතිහාසය සොයා යෑමේදී ත්‍රිපිටකයට අයත් "දීඝ නිකාය" හා "බුද්ධ වංශයේ" සඳහන් තොරතුරු උපකාරී වේ. බුදුරජාණන් වහන්සේගේ විසර්ජනය, මහා පරිනිර්වාණ සූත්‍රයේ එන විස්තරවලට අනුව මහා කාශ්‍යප හිමියන් විසින් බුදුරජාණන් වහන්සේගේ චිතකයට වැඳ නමස්කාර කිරීමත් සමඟ ඉන් අනතුරුව චිතකය විසින්ම බුදුරජාණන් වහන්සේගේ ධාතු දිප්තිමත්ව බැබළෙමින් උඩට මතු වූ බව (ප්‍රජ්වලනය) සඳහන් වේ. බුදුන් වහන්සේගේ අනුගාමිකයන් උන්වහන්සේගේ සිරුරේ ධාතු කොටස්වලට අයිතිවාසිකම් කියාපෑම නිසා උන්වහන්සේගේ සිරුරේ ධාතු කොටස් බෙදා ඒ ඒ කොටස් තැන්පත් කොට ස්තූප කරවා තිබූ බවට කරුණු අනාවරණය වේ. ඓතිහාසික තොරතුරු අනුව දළද වහන්සේ හතර නමක් පිළිබඳව කරුණු අනාවරණය වේ. එක් දළදාවක් තාවතිංසා දෙවියන් විසින් රැගෙන ගොස් පුද පූජා පවත්වන බවත්, දෙවෙනි දන්ත ධාතූන් වහන්සේ ගාන්ධාර දේශයේ පුද පූජාවට භාජනය වී ඇති බවත් තුන්වැනි දළද වහන්සේ කාලිංග දේශයේ ඇති බවත්, හතරවන ධාතූන් වහන්සේ නාගයන් විසින් රැගෙන ගොස් ඇති බව සඳහන් වේ. දළද වහන්සේ වශයෙන් පසු කලෙක දී පූජනීයත්වයට පත්වූයේ බුදුරජාණන් වහන්සේගේ සතර දළදා වහන්සේය. දළදා වහන්සේ ඉතාමත් සුදු පැහැයෙන් යුක්ත විය. සාමාන්‍ය පුද්ගලයන්ගේ දවලම් දත් අනෙකුත් දත්වලට වඩා දික් වීමද, උල් වීමද දක්නට ඇත. එහෙත් බුදුරජාණන් වහන්සේගේ දළදා වහන්සේ සියල්ලම සමව පිහිටා තිබිණ. බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ පිළිබඳ විමසිල්ලෙන් බලන අයකුට පැහැදිලි වේ. සාමාන්‍ය පුද්ගලයකුට ඇත්තේ දත් 32ක් පමණි. එහෙත් බුදුරජාණන් වහන්සේ මහා පුරුෂ ලක්ෂණවලින් යුක්ත වූ නිසා උන්වහන්සේට දන්තධාතූන් වහන්සේලා හතළිස් නමක් වැඩ සිටියහ. දත්



සියල්ලම සමව පිහිටා තිබූ අතර ඒවා සියල්ලම බැබළෙන ප්‍රභාවෙන් යුක්තය.

ශ්‍රී දළද වහන්සේගේ ඉතිහාසය හැදෑරීමේදී 20 වන සත වර්ෂයේදී ලියන ලද ධාථාවංශයේ පරිච්ඡේද 4 කින් කරුණු අනාවරණය වේ. මෙහි ආරම්භයේදීම බුදුරජාණන් වහන්සේගේ පෙර ආත්මභාවය සුමේධ නම් තාපසයාගෙන් පටන් ගෙන බුදුරජාණන් වහන්සේගේ ජීවන චරිතය දක්වාම සඳහන් වේ. බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව ධාතු බෙදා දීමේදී ඛේමා තෙර විසින් බුදුරජාණන් වහන්සේගේ වාම දන්ත ධාතුව ලබාගෙන එය රැගෙන ගොස් දන්තපුරයේ (කාලිංග දේශය) රජ කළ බ්‍රහ්මදත්ත රජතුමාට භාරදී ඇත. බ්‍රහ්මදත්ත රජතුමා හින්දු භක්තිකයකු වුවද පසු කලෙක දී බුද්ධාගම වැළඳ ගත් අයෙකි. දන්ත ධාතුව භාරගත් බ්‍රහ්මදත්ත රජතුමා දළද මන්දිරයක් ඉදිකොට පුද පූජා සත්කාර පැවැත්වීය. බ්‍රහ්මදත්ත රජතුමාට පසුව රාජ්‍යත්වයට පත්වූ කාසි රජා හා ඉන් පසුව රජ වූ සුනන්ද රජ දක්වා රජ කළ රජවරුන් දළද වහන්සේ වැඩ හිඳුවා පුද පූජා සත්කාර පවත්වා ඇත. දන්ත පුරයේ (කාලිංග දේශයේ) රාජ්‍යත්වය ලැබූ සියලුම රජවරුන් දළද වහන්සේට ගරු බුහුමන් දක්වමින් පුද පූජා සත්කාර පැවැත්වීමට කටයුතු කර

04 පිටුවට ▶

"යමකු බැව්වීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



තිබේ.

දන්තපුරය (කාලිංග දේශය) රජ කළ ගුහසීව රජතුමා බෞද්ධයකු නොවීය. ඔහුගේ අමාත්‍යවරයකුගේ උපදෙස් හා මග පෙන්වීම මත බුදුදහම වැළඳ ගන්නා ලදී. බුදුදහම වැළඳ ගැනීමෙන් පසුව ගුහසීව රජතුමා දන්තපුරයේ සිටි සියලුම නිගණ්ඨයින් දන්ත පුරයෙන් පිටුවහල් කරන ලදී. එසේ පිටුවහල් කළ නිගණ්ඨයන් පාටලීපුත්‍ර නගරයට ගොස් එහි රජ කළ පණ්ඩු රජතුමාට පැමිණිලි කරන ලදී. දඩි සිව හා මුන්ම භක්තිකයකු වූ පණ්ඩු රජතුමා මෙම පැමිණිල්ලෙන් කෝපයට පත්ව ඔහුගේ අමාත්‍යවරයකු වූ චිට්ඨයාන කැඳවා නියෝග කරමින් ගුහසීව රජතුමා පණ්ඩු රජතුමා හමුවට රැගෙන එන ලෙස දන්වා චිට්ඨයාන අමාත්‍යවරයා දන්ත පුරයට යවන ලදී. දන්ත පුරයට පැමිණි චිට්ඨයාන අමාත්‍යවරයා ඔහත් හරසරින් ගුහසීව රජු විසින් පිළිඅරගෙන ඔහුට දන්ත ධාතුන් වහන්සේ පෙන්වන ලදී. මෙම අවස්ථාවේ සිදුවූ මහා ප්‍රාතිහාර්යය හේතුවෙන් පැහැදුණු චිට්ඨයාන අමාත්‍යවරයා බුදුදහම වැළඳ ගන්නා ලදී. පණ්ඩු රජුගේ අණ පරිදි චිට්ඨයාන අමාත්‍යවරයා විසින් ගුහසීව රජතුමා හා දන්ත ධාතුන් වහන්සේ පණ්ඩු රජතුමා හමුවට ගෙන යන ලදී. නිගණ්ඨයින්ගේ උපදෙස් පරිදි දළදා වහන්සේ විනාශ කර දැමීමට පණ්ඩු රජතුමා විසින් විවිධ උත්සාහයන් යෙදීය. එහිදී දන්ත ධාතුන් වහන්සේ ප්‍රාතිහාර්යයන් පාමින් විනාශ කිරීමේ උත්සාහයන් සියල්ලම පරාජය කරන ලදී. පසුව පණ්ඩු රජතුමා තුළ දළදා වහන්සේ පිළිබඳ විශ්වාසයක් ගොඩනැගී අවසානයේදී බුදුදහම වැළඳ ගනු ලැබීය. ගුහසීව රජතුමා දළදා වහන්සේ සමග ආපසු දන්ත පුරයට (කාලිංග දේශයට) යවන ලදී. ආපසු පැමිණි ගුහසීව රජතුමා තම දියණිය වූ හේමමාලී කුමරිය උජ්ජේන දේශයේ රජ කුමාරයෙකු වූ දන්ත කුමරුට විවාහ කර දී ශ්‍රී දන්ත ධාතුන් වහන්සේගේ ආරක්ෂාව ඔහුට පවරන ලදී. මෙම කාල සීමාවේදී දන්ත පුරය ආක්‍රමණය කොට දන්ත ධාතුන් වහන්සේ අත්පත් කර ගැනීම සඳහා ආක්‍රමණිකයන් වූ පණ්ඩු රජුගේ බෑණනුවන් දෙදෙනෙකු උත්සාහ කරන ලදී. ආක්‍රමණය පිළිබඳ ගුහසීව රජතුමාට පැලවූ විනාශ මහු තම දියණිය හා බෑනාට දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකාවට රැගෙන යන ලෙස උපදෙස් දී ඇත. ගුහසීව රජතුමාගේ උපදෙස් පරිදි ක්‍රියා කළ දන්ත කුමරු දන්ත පුර නගරයේ දකුණු පස පිහිටි ගංගාවක් තරණය කොට දන්ත ධාතුව එහි ගං ඉවුරේ සඟවා ඇත. නැවත දන්ත පුරයට පැමිණි දන්ත කුමරු තම බිරිඳ හේමමාලා කුමරිය සිත්ද බ්‍රාහ්මණ තාපසයන් ලෙස වෙස් ගන්වා ගෙන ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ සඟවා තිබූ ගං ඉවුර වෙත පැමිණ තිබේ. ඉන්පසු දළදා වහන්සේ රැගත් දන්ත කුමරු හා හේමමාලා කුමරිය නොයෙකුත් කරදර කම්කටොලු මැද්දේ එහි අනතුරුවලින් ප්‍රාතිහාර්යයන් ලෙස ගැලවී තාම්‍රලිප්ති 'මිජ්ජපකකපට්ටන' වරාය වෙත පැමිණ ඇත. එතැන් සිට විදේශ නෞකාවක් මගින් ශ්‍රී ලංකාවේ ලංකාපට්ටන වරාය වෙත පැමිණ ශ්‍රී ලංකාවට ගොඩබැස ඇත.

දන්ත ධාතුන් වහන්සේ ශ්‍රී ලංකාවට රැගෙන ඒම සිදුවූයේ 4 වන ශතවර්ෂයේ මුල් භාගයේදීය. ශ්‍රී දළදා වහන්සේ ශ්‍රී ලංකාවට ගෙන ඒම ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතාම වැදගත් සන්ධිස්ථානයකි. දළදා වහන්සේගේ අති පූජනීය චන්ද්‍රනාමතයට ලක්වූවා සේම ශ්‍රී ලංකා රාජ්‍යය ආරක්ෂා කිරීමේ ඉෂ්ට දේවතාවක් ලෙස සැලකේ.

දළදා වහන්සේ සමග ශ්‍රී ලංකාවට ගොඩ බැසි දන්ත කුමරු හා හේමමාලා කුමරිය පළමු දින දෙක ගතකර ඇත්තේ බ්‍රාහ්මණයකුගේ නිවසකය. පසු දින දන්ත ධාතුන් වහන්සේ මහාසේන රජුට භාරදීම සඳහා අනුරාධපුරය දක්වා ගමන් අරඹා ඇත. අනුරාධපුර නගර සීමාවට පැමිණි පසු මහාසේන රජු බොහෝ කලකට පෙර මියගිය බව අසන්නට ලැබී දන්ත කුමරු හා




"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

හේමමාලා කුමරිය මහත් විස්සෝපයට පත්වී ඇත. එම අවස්ථාවේදී අනුරාධපුරයේ රාජ්‍යත්වයට පත්ව ඇත්තේ තෙරුවන් සරණ ගිය අයෙකු බව දැනගන්නට ලැබී පසුව මහත් සතුටට පත්ව ඇත. මේඝගිරි නමින් විහාරයක් ඇති බවත් එහි පදිංචි මහා තෙරුන් වහන්සේ රජු සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වන බවත් දැනගන්නට ලැබුණු දන්ත කුමරු හා හේමමාලා කුමරිය මේඝගිරි විහාරයට ගොස් මහතෙර හමුවී තමන් කවුදැයි හඳුන්වා දී පැමිණි කාරණය පැහැදිලි කර දී ඇත. දන්ත ධාතූන් වහන්සේ රැගෙන පැමිණි බව ඇසීමෙන් මහත් උද්දාමයට පත්වූ මහතෙරුන් වහන්සේ දන්ත ධාතූන් වහන්සේ විහාරයේ තබා පුද සත්කාර කොට පන්සලේ භික්ෂූන් වහන්සේ නමක් රජතුමා හමුවට යවා ඇත. දන්ත ධාතූන් වහන්සේ රැගෙන ආ බව ඇසීමෙන් මහත් ප්‍රීතියට හා උද්දාමයට පත්ව දන්ත ධාතූන් වහන්සේ රජ මාළිගාවට වැඩමවා ගෙන පැමිණි රජතුමා තම ඔටුන්න මත තබන ලදී. පසුව විශේෂ දළදා මාළිගයක් රජ වාසල අසල ඉදිකරවා එහි දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර තිබේ. බෞද්ධ ජනතාවගේ ඉල්ලීම අනුව කහවණු නවලක්ෂයක් (900,000) වැයකොට දළදා ප්‍රදර්ශනයක්ද පවත්වා ඇත. දළදා ප්‍රදර්ශනය සෑම වර්ෂයකම පැවැත්විය යුතු බවට රාජ නියෝගයක්ද පනවා තිබේ.

චූල වංශය අනුව මේඝවර්ණ රජුගේ රාජ්‍ය කාලයෙන් පසු මෙත්තසේන රජුගේ (ක්‍රි.ව. 428-429) කාලය දක්වා ශ්‍රී දළදා වහන්සේ පිළිබඳ විස්තරයක් සඳහන් නොවේ. දළදාවංශය අනුව මේඝවර්ණ රජුගේ පුත් බුද්ධදාස (ක්‍රි.ව. 337-365) දක්වා කාලය තුළ දළදා වහන්සේට රාජ්‍ය අනුග්‍රහයන් ලබාදෙමින් පුද පූජා පැවැත්වූ බව අනාවරණය වේ. ක්‍රි.ව. 408-428 දක්වා රජ කළ මහානාම රජු ශ්‍රී දළදා පෙරහරේ ගමන් කළ බවද චීන ජාතික හියං සාංගේ දේශාටන වාර්තාවලින් හෙළිදරව් වේ. එකී රාජ්‍ය කාලය තුළ ශ්‍රී දළදා වහන්සේගේ අනුරුවක් චීන අධිරාජ්‍යයා වෙත යවා ඇති බවද සඳහන් වේ. මහානාම රජු චීනය සමඟ ඉතා කිට්ටු රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වා ඇති බව හෙළිදරව් වේ. මෙත්තසේන රජුගේ ඇවෑමෙන් පසු ධාතුසේන රජතුමා (ක්‍රි.ව. 455-473) වසර 25ක කාලයක් රාජ්‍ය පාලනය කර ඇත. ඔහුගේ රාජ්‍ය පාලන සමයේ ගරා වැටී තිබූ ශ්‍රී දළදා මන්දිරය අලුත්වැඩියා කළ බවත්, ඉතා වටිනා ධාතු කරඬුවක් පූජා කර ඇති බවත් ඉතිහාසයේ සඳහන් වේ. මෙයින් ප්‍රකාශ වන්නේ ඔහුට පෙර රජ කළ රජවරුන් දළදා වහන්සේ නොසලකා හැරීමෙන් ජරාවර්ණ වූ බවය.







ධාතුසේන රජුගේ රාජ්‍ය පාලනයෙන් පසු ශත වර්ෂයක පමණ කාලයක් දළදා වහන්සේ පිළිබඳ පැහැදිලි විස්තරයක් සඳහන් නොවේ. ක්‍රි.ව. 571 දී පළමු අග්ගබෝධි රජතුමා රාජ්‍යත්වයට පත්වීමෙන් පසු ඔහුගේ අවුරුදු 33ක රාජ්‍ය පාලන කාලය ශ්‍රී දළදා වහන්සේ පිළිබඳ ස්වර්ණමය යුගයක් විය. දළදා මාළිගය ඉතා වටිනා මැණික් ඔබ්බවා අලංකාර කොට දළදා මාළිගාව ප්‍රතිසංස්කරණය කර ඇත. ඉන්පසුව රජ පැමිණි තුන්වන මොග්ගල්ලාන රජු ඝාතනයට ලක්විය. අනුරාධපුර රාජධානිය බිඳ වැටීමත් සමඟ ශතවර්ෂ 4ක පමණ කාලයක් එනම්, සිව්වන මිහිඳු රජතුමාගේ කාලය දක්වා දළදා වහන්සේ පිළිබඳ කිසිදු විස්තරයක් සඳහන් නොවේ. මෙම කාලය ද්‍රවිඩ ආක්‍රමණයකට පත්වී ඇති අතර දළදා මාළිගාව ඇතුළු බෞද්ධ සිද්ධස්ථාන විනාශයට පත්වී ඇත. මෙම ද්‍රවිඩ පාලනය ක්‍රි.ව. 853 දක්වා පැවතිණි.

අනුරාධපුරයෙන් පසු දළදා වහන්සේ වැඩ වාසය කළේ පොළොන්නරුවේය. එකී කාලය දළදා පෙරහර ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වා ඇත. එය මහනුවර සමයේ පැවැති දළදා පෙරහරට බෙහෙවින් සමාන වූ බව ඉතිහාසඥයෝ ප්‍රකාශ කරති.

පොළොන්නරුවෙන් පසු දඹදෙණි පාලන සමයේදී ක්‍රි.ව. 1236-1270 දක්වා දළදා පෙරහර උත්කර්ෂවත් අන්දමින් පවත්වා ඇත. යාපහුව රාජධානි සමය තුළ දළදා වහන්සේගේ චාරිත්‍ර වාරිත්‍ර ගැන සඳහන් වුවත් දළදා පෙරහර පිළිබඳ විස්තරයක් වංශකතාවල සඳහන් නොවේ. කුරුණෑගල රාජ්‍ය සමය දළදා පෙරහර පැවැත්වූ බවට විස්තරයක් සඳහන් වන්නේ අල්ප වශයෙනි. එහෙත් මෙම කාලය තුළදී දළදා වහන්සේගේ පුද පූජා පිළිබඳ ව්‍යවස්ථා පද්ධතියක් සැකසූ බව සඳහන් වන්නේය. පෙරහර පැවැත්වීම පිළිබඳව හා අනුගමනය කළ යුතු චාරිත්‍ර පිළිබඳව විස්තරයක් සඳහන් වේ.

කුරුණෑගල සමයෙන් පසුව මහනුවර සමය දක්වාම දළදා පෙරහර පිළිබඳ විශ්වාස කළ හැකි තොරතුරු සඳහන් නොවේ. කුරුණෑගල සමයේ තිබූ දේශපාලන අස්ථාවරය නිසා දළදා වහන්සේ ගම්පළට (ගංගාසිරිපුර) ට ගෙන ගොස් ඇත. ගම්පළ නියම්ගම්පාය විහාරයේ තැන්පත් කොට පුද පූජා සත්කාර කළ බව සඳහන් වෙතත් දළදා පෙරහර පිළිබඳ තොරතුරු අනාවරණය නොවේ. ගම්පළින් පසු දළදා වහන්සේ කෝට්ටේට ගෙන ගොස් ඇත. කෝට්ටේ යුගයේදී දළදා වහන්සේ පිළිබඳ තොරතුරු අනාවරණය වුවත් දළදා පෙරහැර පිළිබඳ විස්තරයක් සඳහන් නොවේ. කෝට්ටේ දොන් ජුවන් ධර්මපාල රජු කතෝලික ආගම වැළඳ ගැනීම නිසා දළදා වහන්සේගේ ආරක්ෂාවට බලවත් ප්‍රශ්නයක් විය. මෙම කාලයේදී පෘතුගීසීන් විසින් දළදා වහන්සේ අල්ලාගෙන විනාශ කළ බවට ප්‍රචාරයක්ද ගෙන යන ලදී. දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා කෝට්ටේ සිට දෙල්ගමුවට ගෙන ගොස් කුරහන් ගලක් යට සඟවා තිබිණ. මේ නිසා කෝට්ටේ යුගයේදී දළදා පෙරහර පැවැත්වීම පිළිබඳ විස්තරයක් සඳහන් නොවේ. සතර දේවාල පෙරහර කිසිදු අවහිරයකින් තොරව පවත්වා ගෙන ගොස් ඇත.

ඉන්පසුව දළදා පෙරහර පැවැත්වීම පිළිබඳ සඳහන් වන්නේ මහනුවර යුගයේදීය. 1818 මහ කැරැල්ල අවසාන වී අවුරුදු 10ක් වන තෙක් දළදා පෙරහර පවත්වා නැත. 1828 දී පවත්වන ලද දළදා පෙරහර බ්‍රිතාන්‍ය පාලකයන්ගේ සහයද ඇතිව උත්කර්ෂවත් අන්දමින් පවත්වා ඇත. නැවත 1919 දී ඇතිවූ සිංහල - මරක්කල කෝලාහලය නිසා අවුරුදු 4ක් පවත්වා නැත. නැවත පෙරහැර ආරම්භ කරනු ලැබ ඇත්තේ 1919 වර්ෂයේදීය.

වර්තමානයේ පැවැත්වෙන දළදා පෙරහර චිරාගත සම්ප්‍රදායන් අනුව උත්සවශ්‍රීයෙන් පවත්වාගෙන යනු ලැබේ.

යුනෙස්කෝව විසින් මහනුවර ලෝක උරුම නගරයක් ලෙස නම් කරන ලද්දේ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ඓතිහාසික වැදගත්කම සලකා බැලීමෙනි. එය බෞද්ධයන් වන අපට මහත් ආඩම්බරයකි. මුළු තුන් සිංහලයම මහනුවරට එක්රැස් කෙරෙන දළදා පෙරහර ජාතික වටිනාකමකින් යුත් අපගේ සංස්කෘතික උරුමයකි.

**ලයනල් විජේසුන්දර**
**ලේකම් - විදේශ කටයුතු,**
**ශ්‍රී දළදා මාළිගාව, මහනුවර.**

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# පැවිදි වීමත් සිවුරු හැර යාමත් පිළිබඳ බෞද්ධ නීතිය

බුදු සසුනෙහි පැවිදි බව පතන සැම දෙනාම සසර දුකින් මිදී නිවන් දැකීම සඳහා තමන් පැවිදි කරන්නැයි අයැදිති. කුඩා දරුවන්ට සසර දුක් ගැන වැටහීමක් නොමැති වුවත් සසර පුරුද්ද, ජීවත් වන බෞද්ධ පරිසරය, භික්ෂූන් සමග පවුලේ සබඳතා වැනි කාරණා නිසා ඔවුහු පැවිදි බවට පෙළඹෙති. කෙනෙකු පැවිදි කිරීමට හා උපසම්පදා කිරීමට භික්ෂූන්ට බලය තිබෙන්නේ දෙමව්පිය අවසරය සහිතව ඔහු කැමැත්ත දක්වුවහොත් පමණි. පැවිද්ද සඳහා සංඝ සම්මුතියකින් තොරව කෙනෙකුගේ හිස කෙස් කැපීම පවා පැවිදි විනයට පටහැනිය.

සාමණේරයකුට සිවුරෙහි රැඳී සිටීමට ඉඩ නොලැබෙන පැවිද්ද වැනසෙන කාරණා දහයක් 'දසනාසනා' යනුවෙන් විනයෙහි දැක්වෙයි. පැවිද්ද නසා ගත් සාමණේරයකුට පන්සලෙහි වාසය කිරීමට හා සංඝ ලාභය භුක්ති විඳීමට අයිතියක් නැත. නැවත සිල සමාදානයෙහි සංවරයෙහි පිහිටා පැවිදි බව තහවුරු කරගත යුතුය. මෛථුන සේවනය, සොරකම, මිනිසකු මැරීම හා සෝවාන් බව ආදී තමන් තුළ නොමැති උතුම් මිනිස් ගුණ ඇතැයි බොරු කීම යන සතර පාරාජිකාවලින් එකක් හෝ සිදුකළ උපසම්පදා භික්ෂුව සිවුරු හැරිය යුතුය. වෙනත් විනය වැරදි සිදුකළ භික්ෂූන් සඳහා පබ්බාජනීය කර්මය, සමනුභාෂණ කර්මය, නිස්සාරණ කර්මය, බ්‍රහ්මදණ්ඩය ආදී වශයෙන් වැරැද්දෙහි ස්වභාවය අනුව සිදුකෙරෙන සංඝ සම්මුති භික්ෂු විනයෙහි ඇතුළත් වෙයි.

අංග විකල වූවන්, රෝගාබාධයෙන් පෙළෙන්නන්, අපරාධකරුවන්, හමුදාවෙන් පැන ආ පුද්ගලයන් ඇතුළු පැවිදි නොකළ යුතු පුද්ගලයෝ තිස් දෙදෙනෙක් වෙති. ඔවුන්ට පැවිදි බව පිහිටයි. නමුත් පැවිදි කරන භික්ෂුව වැරදිකරුවෙකි. පැවිදි නොකළ යුතු, පැවිද්ද නොපිහිටන පුද්ගලයෝ එකොළොස් දෙනෙක් වෙති. නපුංසකයා, ද්විලිංගිකයා, මව්පියන් මැරූ තැනැත්තා, සංඝ භේදකයා, හොරෙන් සිවුරක් පොරවාගෙන රහසිගතව අන්‍ය ලබ්ධියක් සරණ ගිය තැනැත්තා ආදී වශයෙනි.

හත්හැවිරිදි විය සම්පූර්ණ පසු ළමයකු පැවිදි බවට පත්කිරීමට විනය නීතිවලින් අවසර තිබේ. එසේ කුඩාවුන් පැවිදි කරන්නේද පුරුවන. එසේ වුවද සිතැරුකම, ගුරු ඇසුරෙන් බණ දහම් හැදෑරීම, ගුරු උපදෙස් පිළිගැනීම, දහම් දෙසීම හා විනය දැනීම යන ගති සිරිත් වයස්ගතව පැවිදි වූවන් තුළ දක්නට ලැබෙන්නේ කලාතුරකින් බව බුදුරදුන් වදාරා ඇත. පැවිදි බව සඳහා ජාති කුලභේදයක් නොමැත. එහෙත් පැවිදි වූ ඇතැම් උසස් කුලීනයෝ කුලමානයෙන් ක්‍රියා කරති. කුලහීන ඇතැම්හු හීනමානයෙන් පෙළෙති. නමුත් ගහපති දරුවන් පැවිදි වූ පසු මාන්නයෙන්, උඩඟුකමෙන් තොරව බුද්ධ වචනය හදාරා ශාසනික අරමුණුවල යෙදෙන බව චූල්ලහත්ථිපදෝපම සූත්‍ර අටුවාවේ දක්වේ. සමාජ අත්දැකීම් ඇසුරෙන් අටුවා ඇදුරන් ඒ අදහස ලියන්නට ඇත. බලහත්කාරයෙන් කෙනෙකු පැවිදි කිරීමත්, උපැවිදි කිරීමත් ධර්ම විනයට පටහැනි වෙයි. ඒ ක්‍රියාවන් දෙකම පුද්ගල කැමැත්ත මත සිදුවන දෙයකි. පුද්ගල කැමැත්ත හෙවත් ස්වච්ඡන්දතාව බුදුදහමට පමණක් ආවේණික ලක්ෂණයකි. පන්සිල් සමාදන් වීම පවා සිය කැමැත්තෙන් සිදුවන්නකි.

බුදුසසුන ඇරඹුණ මුල් යුගයේ ඇතැම් භික්ෂූන් දිය නෑම සිදුකළේ නිරුවතිනි. ඇතැම් භික්ෂූහු නිරුවතින් ගිනිහල් ගෙහි වැඩ කළහ. භික්ෂූන් එසේ නග්නව හැසිරීම විනය නීතිවලින් තහනම් කොට ඇත. සොරු පිරිසක් වනාන්තරයකදී භික්ෂූන්ගේ

"මෝඩයා, මිට දරුවෝ ඇත, මට ධනය ඇත සිය සිතින් උද්දාම වෙයි. තමාට තමාවත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

සිවුරු උදුරා ගත්හ. නිරුවතින් ආරාමයට පැමිණි එම පිරිස ගැන දැනගත් බුදුරදුන් එවැනි ආපදාවකදී නග්නව නොසිට කොළ ඇතිරිලි, ඔලිපුරුණු ආදියෙන් හෝ විලි වසා ගන්නැයි භික්ෂූන්ට නියම කොට ඇත. භික්ෂුවක් සිවුරෙන් තොරව සිටීම සදාචාර විරෝධිය. සිවුරු මැහැවීන් පොරවාගෙන හැසිරෙන අපූරු ජේසියාවල සඳහන් වෙයි. නමුත් යම් හදිසි අන්තරාවක්, සතුරු උවදුරක් හෝ අවශ්‍යතාවයක් නිසා, භික්ෂුවක් තාවකාලිකව සිවුරෙන් තොරව සිටීමෙන් පැවිදි බව අහෝසි නොවෙයි.

මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් සතුරු අනතුරුවලින් මිදෙන්නට සිවුරු පොදිය හිස මත තබාගෙන ගිහි ඇඳුමෙන් ගිය බවක් අසන්නට ලැබේ. පැවිද්දෙකු සිරුරෙන් ගැලවූ සිවුර සමීපයෙහි තබාගත යුතු බව විනයෙහි දක්වේ. මෙක්සිකෝවේ සිටි ලාංකික බෞද්ධ පිරිසක් ආගමික කටයුත්තකට භික්ෂුවකට ආරාධනා කළත්, කතෝලික රටක් නිසා ගමන් වීසා නොලැබිණ. ඒ ගැන දැනගත් බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය නාහිමියන් පැවසුවේ, සිවුරු අධිෂ්ඨාන කරගෙන තාවකාලිකව උපැවිදිව ගිහියකු ලෙස ඒ රටට ගොස් සිවුරු නැවත පොරවාගෙන ඒ ආගමික කටයුත්ත ඉටුකර දෙන්න යනුවෙනි. එහි අරමුණ සිවුරු හැරීම නොවන බැවිනි. එහෙත් භික්ෂුවක් තාවකාලිකව සිවුරෙන් මිදෙන්නේ භික්ෂු විනයට පටහැනි යම් ක්‍රියාවක් සඳහා නම්, එම වැරැද්දට අදාළ විනය නීති අනුව ඔහු භික්ෂුත්වය කෙලෙසා ගනියි. නමුත් උපැවිදි වන අදහසක් නොතිබුණ බැවින් භික්ෂුත්වය අහෝසි නොවේ. පිළියම් කළහැකි වරදක් නම්, එම භික්ෂුව විනය ප්‍රඥප්ති මගින් පැවිදි බව යථා තත්ත්වයට පත්කර ගත යුතුය. උපසම්පදාවෙහි සිටි සාමණේරයා භිම් වෙට පත්කොට නැවත පැවිදි කෙරේ. එම පැවිදි උපසම්පදා විනය කර්මයෙහි කොටසකි. භික්ෂු සම්මුතියකි. එබැවින් සපුන් ගත අවස්ථාව ලෙස සැලකෙන්නේ මුලින් පැවිදි වූ දිනයයි.

පාරාජිකපාලියේ චීවර වග්ගයේ "තිචීවර අවිප්පවාස සම්මුතිය" නමින් තුන් සිවුරෙන් වෙන්ව සිටීම සඳහා භික්ෂූන්ගෙන් අවසරය ලබාගැනීමේ විනය පිළිවෙතක් තිබේ. එක් රෝගී භික්ෂුවකට ප්‍රතිකාර සඳහා නෑයන්ගේ ඉල්ලීම අනුව නිවසට යාමට අවශ්‍ය විය. සිවුරු පොරවාගෙන එසේ කළ නොහැකි නිසා ඒ ගැන බුදුරදුන්ගෙන් විමසීය. එවිට බුදුහිමියෝ සංඝ සම්මුතියක් ලබා ගන්නැයි උපදෙස් දුන්හ. එහිදී සිදුකෙරෙන්නේ සිවුරු තාවකාලිකව භික්ෂූන්ට භාරදීමකි. සංඝ සම්මුතියකින් තොරව එක් රැයක් හෝ සිවුරු නොමැතිව වෙසෙන භික්ෂුව නිසැකි පචිති නම් වරදට ගොදුරු වෙයි. වෛද්‍ය ප්‍රතිකාර සඳහා භික්ෂූන්ගේ සිවුරු ඉවත් කිරීමෙන් පැවිද්දට හානියක් නොවේ.

වර්තමානයේ ක්‍රියාත්මක භික්ෂූන්ට අදාළ නීති රීති අනුව විහාරාධිපති තනතුරු පත්කිරීම, සාංඝික දේපළ හිමිකම හා වෙනත් පැවිදි අයිතිවාසිකම් සඳහා භික්ෂුත්වයෙහි නිරතුරුබව භාවය වැදගත් වෙයි. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර්ගිමෙන්ද පැවිදි අයිතිවාසිකම් අහිමි වෙයි. අද්‍යතනයේද යටත්, ඇතැම් භික්ෂූන් තාවකාලිකව සිවුරු හැර පසුකාලෙක නැවත සිවුරු දරාගෙන මුල් පැවිද්ද සටහනේ භික්ෂු ජීවිතයක් ගත කිරීම නිසා සාංඝික හා අධිකරණ කටයුතුවලදී ගැටලු මතුවී තිබේ. කිසියම් කාලසීමාවක් සිවුරු හැර සිටි භික්ෂුවකගේ පැවිදි වූ දිනය ලෙස සැලකෙන්නේ ප්‍රථම අවස්ථාවද? නැතිනම්, උපැවිදිව සිට නැවත සිවුරු දරූ දිනයද? යන්න භික්ෂූන්ගේ ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ අර්බුදවලදී අධිකරණයේ අවධානය යොමුවී තිබේ.

සිවුරු හැරීම යන්න නීතියෙහි නිර්වචනය කරන්නේ භික්ෂුවට නියමිත වස්තුවලින් මිදී භික්ෂු භාවයෙන් ඉවත්ව ගිහියකු බවට පත්වීමයි. සිවුරු හැර යාම හෙවත් උපැවිදි වීම නීත්‍යානුකූල වන්නේ ස්වේච්ඡාවෙන් සිදුකළහොත් පමණි. ගාල්ලේ විහාරස්ථානයක අධිපතිකම සඳහා භික්ෂූන් දෙනමක් නඩු කළහ. කුලගේ රතනජෝති තෙරුන්ගේ ශිෂ්‍යයකු වූ විජිතසාර භික්ෂුව තාවකාලිකව උපැවිදිව සිට නැවත පැවිදි වූ කෙනෙකි. ඇම්බිලිකාර භික්ෂුව රතනජෝති තෙරුන්ගේ උපසම්පදාවෙන් ශිෂ්‍යයෙකි.

විජිතසාර භික්ෂුව මුලින් පැවිදි වුවත්, සිවුරු හැර නැවත පැවිදි වූ නිසා ශිෂ්‍ය භාවයේ ජ්‍යෙෂ්ඨත්වය අහෝසි වී ඇත යන්න ඇම්බිලිල්ලේ තර්කය විය. විත්ති පාර්ශ්වයෙන් ඉදිරිපත් කෙරුණ කරුණුවලින් අනාවරණය වූයේ විජිතසාර භික්ෂුව සිවුරු හැරියේ පැවිදි ගුරුවරයාගේ ඉල්ලීම පරිදි, පවුලේ ඥාතීන්ගේ ඇප උපස්ථාන යටතේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ අදහසිනි. එබැවින් චේතනාත්මකව ස්වේච්ඡාවෙන් සිවුරු අත්හළ බවක් නැතුරු නොවේ. එනිසා මුල් පැවිදි බව ඡේදනය වී නැතැයි අධිකරණය විජිතසාර භික්ෂුවගේ ජ්‍යෙෂ්ඨත්වය පිළිගෙන තිබේ. (සෝමරතන තෙර එරෙහිව ජිනරතන තෙර (1941)42 නව නීති වාර්තා 361) මෙම තීරණය භික්ෂු විනයටද එකඟය. මෙහිදී අවධානයට ගත යුතු තවත් කරුණක් ඇත.

කිසියම් අනුමතයකට නියම වූ භික්ෂුවක් ගිහියකු ලෙසින් සිවුරු ගලවා සිරකරුවන්ට නියමිත ඇඳුමක් දෙයි. එයින් නිදහස් වන විට සිවුරු පොරවා ගනියි. එයින් භික්ෂු භාවය අහෝසි වේයිද? යන ප්‍රශ්නය ගුණරතන තෙරුන්නාන්සේ එදිරිව රතනපාල



තෙරුන්නාන්සේ (නව නීති වාර්තා 227) නඩුවේදී මතුවිණ. බන්ධනාගාර නීතිය නිසා මිස භික්ෂුවක් ස්වේච්ඡාවෙන් තම සිවුර ඉවත් කිරීමක් සිදුනොකරන නිසා එය සිවුරු හැරීමක් වශයෙන් සැලකිය නොහැකි යැයි එහිදී තීරණය කර ඇත.

ගල්කිස්ස උසාවියේ පැවති කුසලඤාණ තෙර එදිරිව අස්සජි තෙර (2005-1 ශ්‍රී ලංකා නීති වාර්තා 281) නඩු විභාගයේදී භික්ෂුවක් විහාරාධිපති තනතුරක් වෙනුවෙන් ඇම්බිලිල්ලක් ඉදිරිපත් කළේය. පවුල උපාවන්නාන්සේගේ ශිෂ්‍ය භික්ෂුවක් තමන්ට එම විහාරාධිපතිකම උරුම බව අධිකරණයට පැවසීය. එම ඉල්ලීමද ඇම්බිලිල්ලටම ගොනු විය. විත්තිකාර භික්ෂුව නිසා සිටියේ එම මුල් ඇම්බිලිකාර භික්ෂුව 1998 වසරේ සිවුරු හැර ගිහි නමකින් ජාතික හැඳුනුම්පතක් සඳහා ඡායාරූප ලබාගත් බවයි. ඒ බව සාක්ෂි විනිසුරු ප්‍රකාශයකින් තහවුරු විය. එම භික්ෂුව නැවත සිවුරු දරාගෙන 1999 වසරේ ඇම්බිලිල්ලේ පාර්ශ්වකාර ශිෂ්‍ය භික්ෂුව පැවිදි කර ඇත. අධිකරණ තීරණය වූයේ සිවුරු හැරීම චේතනාත්මකව සිදුකළ නිසා නැවත සිවුරු දරාගෙන භික්ෂුවක් ලෙස සිටීම වලංගු නොවන බවයි. එසේ සිටිමින් මතු පැවිදි කළ ශිෂ්‍යයාට ශිෂ්‍ය භාවයක් නොමැත.

**පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි**
**අස්ගිරි මහා විහාරීය කාරක සංඝ සභික**

"යමක් කොට පසුතැවෙන්නට වේද, යම්ක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ !"

# 8


# දුකින් මිදෙන හැටි පහදා දුන්
# සීහනාද සූත්‍රය

ජාතක කතා මගින් ගැමි කතාවලත් සිංහයාට විශේෂ තැනක් හිමිවේ. ගැමි ව්‍යවහාරයේ සිංහයා යනු කැලේ රජාය. කැලේ හවු විසඳුවේ සිංහයාය. සියලු සතුන් යටත් කරගෙන බලවත්තව, ශක්තිවන්තව සිටියේ සිංහයාය. සාමාන්‍යයෙන් ගොදුරක් සොයා යන්නට සූදානම් වූ විට ගල් ලෙනින් හෝ සිටින තැනින් එළියට පැමිණ ඉදිරිපස පා ඉදිරියටද පසු පස පා පසුපසටද දිගුකර ඇඟමැලි කඩාදැමීම සිංහ සිරිතය. එය විජ්ම්භනය නම් වේ. ඉන්පසු ශරීරය හොඳින් සොලවා ඇනුත් හැර ඌ සිවු දෙසම බලයි.

ඊළඟට තමා ගොදුර සොයා යන දෙසට හැරී තුන් වරක් සිංහ නාද පවත්වයි. එය තමා එන බව දන්වන නියෝගයක් , අනතුරු ඇඟවීමක් වැන්න.

එම සිංහ නාදය ඇසෙන කැලෑ සතුන් සිංහ නාදය ඇසුණු සැණින් තමන් යන ගමන් බිමින් නවතා එහා වළලටම රිංගා ගනිති.

ජලයෙහි ජීවත් වන කිඹුලන්, ගෙම්බන් වැනි සත්තු සිංහ නාදය ඇසෙද්දීම වතුරට පැන නොපෙනී යති.



කැලේ එළිමහනෙහි හැසිරෙන මුවන්, හාවුන්, ගෝනුන් වැනි සතුන් කැලය පීරා දිව යයි. ගස්වල තුවු සැදූ කුරුල්ලෝ පවා සිංහ නාදය අසා බියවැදී අහසට නැග ඈතට පියඹා යති.

මේ බිම්වලට හුරුවූ දම්වැල්වලින් ගැට ගැසූ අලි පවා සිංහනාදය ඇසී මළ මූත්‍ර පිටකරමින් දම්වැල් කඩාගෙන දිවයන්නට සැරසෙති.

සිංහ නාදය වනාන්තරයට එතරම් ප්‍රබලය, භයංකරය. සිංහ නාදයට එවීනයකමක් ලැබෙන්නට හේතු දෙකකි. එකක් සිංහයා සෑම විටම කෑ ගසන සත්වයකු නොවේ. ඌ දවසට වරක් හෝ දෙවරක් කෑ ගසන සත්වයෙකි. බොහෝ සත්වයන් එනයේ කෑ ගසන්නේ යම්ක් දක බියට පත් වීමෙනි. එහෙත් සිංහයා කෑ ගසන්නේ නිර්භය භාවයෙනි. මේ කාරණා දෙක මත සිංහ නාදය කැලෑවට වැදගත්ය.

තථාගත බුදුපියාණන් වහන්සේ ඉහත දක්වූ සිංහ නාදය උපමාවට ගෙන තමන් වහන්සේ සිංහ නාදයක් පැවැත්වූ බව සඳහන් කරමින් සූත්‍ර දේශනාවක් කළහ.

එම සූත්‍රය අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයට අයත් සීහ නාද සූත්‍රයයි.


සම්මා සම්බුද්ධත්වයට පත්ව ධම්මචක්කපවත්තන සූත්‍රය දේශනා කොට චතුරාර්යය සත්‍ය පැහැදිලි කිරීම හරියට සීහ නාදයක් කිරීමක් වැන්න.

සෝ ධම්මං දේසේසි
ඉති සක්කායෝ
ඉති සක්කාය සමුදයෝ
ඉති සක්කාය නිරෝධෝ
ඉති සක්කාය නිරෝධ ගාමිණී පටිපද

මහණෙනි මෙය සක්කාය වන්නාහ. මහණෙනි මේ හේතුව නිසයි සක්කාය හටගන්නේ. ඊළඟට මේක නිසයි සක්කාය නිරුද්ධ වෙන්නේ. මහණෙනි සක්කාය නිරුද්ධ කිරීමට ඇති ප්‍රතිපදාව මෙය මැයි වශයෙන් පැහැදිලිව කරුණු කාරණා විග්‍රහ කරන සේක.

මෙහි 'සක්කාය' යනු කුමක්ද? 'සත්' යනු ස්ථිර නොවෙනස් යන අරුත් දේ. "කාය" යනු සමූහාර්ථය. රූප සමූහයක් නම් ඒ රූප කායයි. වේදනා සමූහයක් නම් එය වේදනා කායයි. ස්ථිර වෙනස් නොවෙන කාරණා සමූහයක එකතුව "සක්කාය" නම් වේ.

ඉහත 'සක්කාය' යන්නෙන් කුමක් අර්ථ ගන්වන්නේද යන්න අටුවාවේ විස්තර වේ. එනම් පංචස්කන්ධයයි. වෙනස් නොවන ස්ථිර පංචස්කන්ධයක ඇති බව කෙනෙකුට සිතෙයි නම් එය සක්කාය දිට්ඨි නම් වේ. සෑම පුද්ගලයකුම නිර්මාණය වී ඇත්තේ පංචස්කන්ධයෙනි. පංචස්කන්ධය නැති තැන සත්වයා නැත. ඒ පංචස්කන්ධය නම් රූප, වේදනා, සඤ්ඤා,



සංඛාරා, විඤ්ඤාණ නම් වේ.

මේ පංචස්කන්ධය යම් තැනෙක එකතු විණිද ඒ තැන 'ජාති' යන තත්ත්වය උපදී. ජාති යනු ඉපදීමයි. ස්කන්ධ පංචකයේ පහළ වීම හෙවත් ඉපදීම දුකයි නම් 'සත්කාය දුක' බව පැහැදිලි කර ගත යුතුය. ඒ අනුව පංචස්කන්ධයෙහි කිසිවක් සැප ලෙස ගත නොහැක. බුද්ධ දේශනාවට අනුව සංඛිත්තේන පංච උපාදානස්කන්ධා දුක්ඛා මහණෙනි පංචස්කන්ධයම දුක සහිත වේ.

මේ පංච උපාදානස්කන්ධය දුක සහිතය. එය නිරන්තරව වෙනස් වන්නේය. එබැවින් සත්කාය හෙවත් පංච උපාදානස්කන්ධය අනිත්‍යය. මෙවැනි බැරෑරුම් කාරණා භාරතීය සමාජයේ අලුත් ශාස්තෘවරයෙකු දේශනා කිරීම සිංහ නාදයකි. මෙය එතෙක් භාරතීය ඉගැන්වීම් ඇදහීම් අතර උඩුගං බලා ගිය දේශනාවකි.

සත්කාය සමුදය හෙවත් පංචඋපාදානස්කන්ධය ඇතිවීමට දුක හට ගැනීමට හේතුව තණ්හාවයි. තණ්හාව නැති කිරීම නිවනයි. නිවන ඇති කර ගැනීමට ඇති මග ආර්ය අෂ්ටාංගික මගයි යනුවෙන් චතුරාර්ය සත්‍යය පිළිබඳව දේශනා කළහ. මේ දේශනාව ඇසීමෙන් වඩාත් බියට පත්වූ පිරිස නම් දීර්ඝායුෂ විඳි වර්ණවත් දෙවියන්ය. ඔවුහු මරණය, ලෙඩවීම ආදිය ඇසීමෙන් දුක ගැන ඇසීමෙන් බොහෝ බිය ඉපිදවූහ. මනුෂ්‍ය ලොව අවුරුදු 50ක් චතුම්මහාරාජික දිව්‍ය ලෝකයේ එක දිනකි. මනුෂ්‍ය ලොව අවුරුදු 100 ක් තව්තිසා දෙව්ලොව එක දවසකි.

එයට උදාහරණ දක්වමු.

තව්තිසාවේ එක් දෙවියෙක් සහ දෙවඟනක් දෙව්ලොව උයනක මල් නෙළමින් සිටියහ. එහිදී දෙවඟන කර්ම ශක්තිය අනුව දෙව්ලොවින් චුතව මනුෂ්‍ය ලෝකයේ කුලවත් පවුලක උපන්නාය. ටික දිනක් ගතවද්දී ඇයට ජාතිස්මරණ ඥානය පහළ විය. ඇය නැවත තව්තිසාවේ පෙර දෙවියන් ළඟ පහළ වීමේ වුවමනාවෙන් මහත් පින්කම් කළාය. ඇය මනුෂ්‍ය ලොව සිය වසක් ආයු විඳ මරණයට පත්ව යළි තව්තිසාවේ පුරුදු තැනහිම උපන්නාය. එදද පෙර දෙවියන් උයනෙහි මල් නෙළන්නේය. දෙවියන් දෙවඟනට කතා කොට සොඳුරිය ඔබ පෙරදින කොහි ගියේ දැයි විමසීය. තව්තිසාවේ දෙවියන්ට බුදුහාමුදුරුවන්ගේ පිරිනිවීම පවා දින 25 කුත් පැය ගණනකි.

ඒ දෙවිවරු අවුරුදු 30,000, 40,000, 50,000 වශයෙන් ජීවත් වෙති.


ජීවත් වන කාලය දීර්ඝ හෙයින් ඔවුන්ට රූපයෙහි වෙනස්වීමක් දකින්නට නැත. හැම දිනම එකා සමාන බවට අදහස දෙවියන් සතුව තිබිණ. නමුත් බුදුරජාණන් වහන්සේ රූපය වෙනස් වේය, ස්ථිර නැත, විනාශ වන්නේය යන සිංහ නාදය කරද්දී දෙවියෝ බියට පත්වූහ. දෙවියන්ට ලෙඩ වීමක් දකින්නට නැත. ලෙඩ වී මරණාසන්න වනු දකින්නට නැත. මරණය ගැන ඔවුන් දන්නේ නැත. පින් අවසන් වීමෙන් ක්ෂණිකව දෙව්ලොවින් චුතව යයි . එබැවින් දුක දකින්නට දුක අවබෝධ කරගන්නට පවතින අවස්ථාව දෙවියන්ට අවමය.

බුදු හිමියන් දුක පිළිබඳ කාරණා සහිත විග්‍රහ කරද්දී , දෙවියන් බිය වූයේ එම නිසාය. දෙවියෝ බියෙන් සලිත වන්නට වූහ. මේ සියල්ල යම් දිනක අපටද දමා යන්නට වන බව දෙවියෝ සිතන්නට වූහ.


සිංහ නාදයක් ඇසීමෙන් වනයේ සතුන් ජීවිත රැක ගන්නට ආරක්ෂිත ස්ථාන කරා දිව යන්නේ යම් සේද බුදුරජාණන් වහන්සේගේ අභීත සිංහ නාද දේශනාව අසා සංසාර විමුක්තිය සඳහා දෙව් මිනිසුන් සියල්ලෝ කුසලයට නැඹුරු වන්නට වූහ. සසර ආරක්ෂක ස්ථාන සොයන්නට වූහ. දෙවියන්ටත් වඩා මනුෂ්‍යයකුව ඉපදුනකුට දුක විඳින්නට තිබෙන අවස්ථාව වැඩිය. දුක දකෙන අවස්ථා අධිකය. එය අවබෝධ කොටගෙන දුකින් මිදෙන්නැයි බුදුරජාණන් වහන්සේ අනුශාසනා කොට වදාළහ.

**පූජ්‍ය හලල්ලේ චන්දකිත්ති හිමි**

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."




# නිකිණි පුර පසළොස්වක පොහොය දින පිළිවෙත් සුරකිමු



පූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ශාසනාවන්ත පින්වතුනි,

අද නිකිණි පුර පසොළොස්වක පොහෝ දිනයයි. අද ශාසනික වශයෙන් වැදගත් සිදුවීම් කිහිපයක් සිදුවී ඇත. වස් සමාදන්වීම් සිදුවන්නේ ඇසළ පුර පසොළොස්වක පොහෝ දිනයෙන් පසුව එළඹෙන අව, පෑළවිය දිනයේය. එය පෙරවස් එළඹීම වශයෙන් හඳුන්වයි. යම් අපහසුතාවයක් නිසා උපසපන් භික්ෂු නමකට පෙරවස් එළඹීමට නොහැකි වුවහොත් පසුවස් එළඹීම සිදුකළ යුතුය. එසේ පසුවස් එළඹීම සිදුකළ යුත්තේ මේ නිකිණි පුර පසොළොස්වක දිනෙන් පසු එළඹෙන අව පෑළවිය දිනයේය.

දෙවන වැදගත්කම වන්නේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු තථාගත බුදුරජාණන් වහන්සේ පුරා පන්සාළිස් වසක් මුළුල්ලේ දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය විසිරුණු මල් ගොඩක් මෙන් එක් රැස් කිරීමක් නැතිව පැවතුණි. අනාගතය සඳහා ශ්‍රී සද්ධර්මය සුරක්ෂිත කිරීමේ වගකීම බාරගත් මහා

"සියල්ලෝ දඬුවමට තැති ගනිති. සියල්ලෝ මරණයට බිය වෙති. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ක්ෂීණාශ්‍රව මහරහතන් වහන්සේලා පන්සිය නමක් එකතුව අජාසත් මහ රජතුමන්ගේ රාජානුග්‍රහය ලැබ මුල් මාසයන්හි විහාරාරාම පිළිසකර කොට සප්තපර්ණී ගුහාද්වාරයේ කරවන ලද දර්ශනීය දම්සභා මණ්ඩපයේ දී පළමුවරට ශ්‍රී සද්ධර්මය සංගායනා කරන ලද්දේ අදවන් පුන් පොහෝ දිනකය. අද අපට නිර්මල සද්ධර්මය නොනැසී ලැබී තිබෙන්නේ ඒ අතීත යතිවරයන් වහන්සේලා ගත් දුරදර්ශී වැඩපිළිවෙළ නිසාය.

නිකිණි පුර පසළොස්වක පොහෝ දින අනෙක් වැදගත් කටයුත්ත වන්නේ ජීවමාන බුදුපියාණන් වහන්සේ සේ සලකමින් ලෝ පුරා සැදැහැති සියලු දෙනා ගරු සත්කාර කරන ශ්‍රීමත් දළද වහන්සේ උදෙසා අනාදිමත් කාලයක් මුළුල්ලේ අභිමානයෙන් සිදුකරන ඇසළ මහ පෙරහරේ අවසන් රන්දෝලි පෙරහර ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමයි. මෙදින රාත්‍රියේ පෙරහර අවසානයත් සමඟ ඓතිහාසික ගෙඩිගේ රාජමහා විහාරයේ පෙරහර කරඬුව තැන්පත් කර පසුදින ගැටඹේ දියකපනා තොටට ගොස් දිය කැපීමේ මංගල්‍යය අවසානයේ දවල් පෙරහරින් ශ්‍රී දළද මාළිගාවට වැඩමවයි.

මෙවන් වර්ණනාකම්වලින් යුත් නිකිණි පුන් පොහෝ දින වස් කාලයක් සමඟ එළඹෙන පළමු පුන් පොහෝ දිනය බැවින් සෑම විහාරස්ථානයකම පාහේ භික්ෂූන් වහන්සේලාගේ අනුශාසනා පරිදි විවිධ පින්කම් පවත්වනු ලැබේ. ගිහි පැවිදි දෙපක්ෂයේ සබැඳියාව මනා තහවුරුවන මෙම කාලය පුණ්‍ය කාලයක් ලෙස සැලකිය හැකිය.

වස් කාලයේ වස් සික්ෂාපදයන් සමාදන්ව විහාරස්ථානයේ වාසය කරන භික්ෂූන් වහන්සේලාට උන් වහන්සේලාගේ මූලික අවශ්‍යතාවන් වන චීවර, පිණ්ඩපාත , සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිව් පසයෙන් උපස්ථාන කිරීම උන්වහන්සේලා වාසය කරන ගොදුරු ගමට අයත් සියලු දායක කාරකාදී පින්වතුන්ගේ යුතුකමයි. මේවා ආමිස දාන ලෙස බුදුපියාණන් වහන්සේ හඳුන්වා ඇත. මෙසේ ආමිස දානයෙන් තමාට සලකන, උපස්ථාන කරන ගිහි පිංවතුන්ට භික්ෂූන් වහන්සේලා ද සැලකිය යුතුය. එය බුදුපියාණන් වහන්සේ ගිහි ජනතාවට කරන ප්‍රත්‍යුපකාරයක් ලෙස සලකා ඇත. එසේ භික්ෂූන් වහන්සේලා ඔවුන්ට උපකාර කළ යුත්තේ දහම් කරුණු පහද දෙමින් මෙලොව පරලොව දෙලොව යහපත සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමෙනි. 'කරෝථ ධම්මදානේන - තේසං පච්චුපකාරකං'

භික්ෂුව යනු, සිඳුණු බිඳුණු වස්ත්‍ර දරමින් ගෙන් ගෙට ගොස් ලැබෙන පිණ්ඩාහාරයෙන් යැපෙන බැඳීම්වලින් තොර නිර්වාණගාමී පිළිවෙතෙහි ගමන් කරමින් ලද දෙයින් සතුටු වෙමින් අල්පේච්ඡ දිවියක් ගත කරන බුද්ධ ශ්‍රාවකයෙකි. මෙය භික්ෂුව හැඳින්වීම සඳහා සාම්ප්‍රදායිකව ඇති නිර්වචනයයි. භාරතීය නරේශ්වර වූ ධර්මාශෝකයන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර වූ මහා මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයෙන් ආරම්භ වූ ලාංකීය භික්ෂු පරපුරේ පරමාදර්ශයද එය විය. එහෙත් ලාංකීය නරපතියන්ට අර්ථයෙන් ධර්මයෙන් උපදෙස් දෙමින් පාලක පක්ෂය මෙන්ම පාලිත පක්ෂයද ධාර්මික චර්යා ඇත්තවුන් බවට පත් කිරීම උන්වහන්සේගේ පරම කාර්ය භාරය විය. ජාතියට පණ දෙමින්, ආගමට ජවය දෙමින් ජාතියක් ආගමක් දෙකක් නොව එකක් බවට පත්කිරීම උන්වහන්සේගේ එම සත් කාර්යයේම කොටසක් විය. අද වනතෙක් මෙම බැඳීම ශක්තිමත්ව පවතින්නේ අතීත භික්ෂුව අපට දායාද කළ එම අසහාය සේවාව නිසාය. භික්ෂුව ජාතියේ මුරදේවතාවන් යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ මේ නිසාය.

පොදු බවෙහි සංකේතයක් බඳු භික්ෂූන් වහන්සේ පරාර්ථ චර්යාවෙහි නිරත වෙමින් සම්බුදු දහම ක්‍රියාවෙහි යොදවන අතර වස් කාලය තුළ එක්තැන්ව වාසය කරමින් තමන් වහන්සේගේ ආධ්‍යාත්මික දියුණුව ඇති කරගැනීම සඳහා වෙහෙස වෙති. එබැවින් මේ කාලයේ වස් සමාදන් වන භික්ෂූන් වහන්සේලාගෙන් වෙන කාලවලට වඩා ගොදුරු ගමට විශාල සේවාවක් සිදුවන කාලයකි. තථාගත බුදුපියාණන් වහන්සේ ජීවමාන කාලයේ ද උන්වහන්සේලාගේ පරිනිර්වාණයෙන් පසුවද භික්ෂූන් වහන්සේලා බොහෝ පිරිසක් කෙලෙසුන් නසා උතුම් අර්හත් සත්ත්වයට පත්ව ඇත්තේ මේ උතුම් වස් කාලයේ දීය. එබැවින් මේ වස් කාලය තුළ දී භික්ෂූන් වහන්සේලා තම තමන්ගේ ප්‍රදේශවල වස් සමාදන් කරවා වැඩ වාසය කරවා ගැනීමට බොහෝ පිරිස් උත්සුක වූ බව අපේ ධර්ම සාහිත්‍යයේ සඳහන්ව ඇත. සිය විමුක්තිය උදෙසා ආධ්‍යාත්මික ගවේෂණයෙහිලා යෙදෙන භික්ෂූන් වහන්සේලාට මේ වස් කාලයේ උපස්ථාන කිරීමෙන් අප්‍රමාණ කුසල් රැස්කර ගත හැකි බව අදද බොහෝ දෙනෙක් විශ්වාස කරන්නේ මේ නිසාය.

තමාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන භික්ෂූන් වහන්සේලා උදෙසා දායකයන් විසින් පිළිපැදිය යුතු ආකාරය තථාගත බුදු පියාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ මෙසේ දේශනා කොට ඇත.

"පඤ්චහි ඛො, ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨාතබ්බා - මෙත්තෙන කායකම්මෙන මෙත්තෙන වචීකම්මෙන මෙත්තෙන මනො කම්මෙන අනාවටද්වාරතාය ආමිසානුප්පදානෙන"

එනම්, මෛත්‍රී සහගත කටයුතුවලින් මෛත්‍රී සහගතව වචනවලින් මෛත්‍රී සහගතව සිතුවිලිවලින් අවශ්‍ය ඕනෑම වෙලාවක තමාගේ නිවසට වැඩම කිරීමට සුදුසු වන පරිදි සූදානමින් ගෙවත් නොවසන ලද දොර ඇතිව මෙන්ම පෙර සඳහන් කළ පරිදි චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිව්පසයෙන් උපස්ථාන කිරීමෙන් කටයුතු කිරීම දායකයින්ගේ යුතුකමයි.


මෙසේ තමන්ට සලකන දායක කාරකාදීන්ට භික්ෂූන් වහන්සේලා ද ප්‍රත්‍යුපකාර වශයෙන් කාරණා හයකින් අනුග්‍රහ කළ යුතු බව තථාගත බුදුපියාණන් වහන්සේ මෙසේ දේශනා කොට ඇත.

"ඡහියානෙහි කුලපුත්තං අනුකම්පන්ති - පාපා නිවාරෙන්ති කල්‍යාණෙ නිවෙසෙන්ති කල්‍යාණෙ මනසා අනුකම්පන්ති අස්සුතං සාවෙන්ති සුතං පරියොදපෙන්ති සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති"

එනම් පාපයෙන් වැළැක්වීම යහපතෙහි යෙදවීම අනුකම්පා සහගතව යහපත් මනසින් කටයුතු කිරීම නොඇසූ දේ ඇස්වීමට සැලැස්වීම ඇසූ දෙය නැවත ඇස්වීමට සලස්වා කරුණු හරිහැටි අවබෝධ කරදීම හා යහපතෙහි යෙදවීමෙන් ස්වර්ග මාර්ගය පෙන්වා දීම යන කාරණා හයෙන් භික්ෂූන් වහන්සේ තමාට මෛත්‍රී සහගතව සිව්පසයෙන් උපස්ථාන කරන දායකයන්ට සංග්‍රහ කළ යුතුය. එය ඔවුන්ට ධර්මදානයෙන් කරන අනුග්‍රහයකි.

එබැවින් මේ පින්බර වස්කාලයේ ගිහි - පැවිදි යුතුකම් හා වගකීම් නිසි අයුරින් සිදුකරගෙන යමින් අර්ථවත් දිවියක් ගත කරමින් අධ්‍යාත්මික දියුණුව ඇතිකර ගනිමින් මෙලොව පරලොව උභයාර්ථ සිද්ධියම ඇතිකර ගැනීමට ශ්‍රීමත් දළද වහන්සේගේ ආශිර්වාදයෙන් ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

"ලම් ඇසක සිට උඩේ විනාශයෙන් මිදිය හැකිද, එමිනු පැයක් ආපසෙම්න් යැත. මුහුද මැදත් ඇත. ජීවිත සුපරටපවින් ඇත. එමිනු මීම පොදෙක් දොළ නොමේවත් ඇත්තේ ඇත."



# බුදුන් වහන්සේ
## දවස ගතකළේ මෙහෙමයි

පාරමිතා පිරීම යනු උත්තරීතර ගුණ ධර්ම සම්පූර්ණ කිරීමෙන් එක් තැන් කෙරෙන අපරිමිත සුචරිත ශක්තියකි. මින් අවුරුදු දෙදහස් හයසියයකට ඉහතදී පාරමිතා ශිල්පියාගේ පරිසමාප්ත නිර්මාණය හැටියට සිද්ධාර්ථ කුමරුවන්ගේ පහළවීම සිදුවිය. තිස්පස් වැනි වියේදී ගයාවේ අපරාජිත භූමියේදී සම්මා සම්බෝධියෙන් ලොවුතුරා බුදු පදවියට පත්ව, මානව වර්ගයාගේ දනගත් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය රත්නය බවට පත්වූ අසමසම තථාගත බුදුපියාණන් වහන්සේගේ දින චරියාව පිළිබඳ සැකෙවින් දත සිටීම බොදු ජනයාට මහත් වූ භාග්‍යයකි.

පරෝපකාරයෙන් වෙහෙසට පත් නොවීම මූලික ප්‍රතිපත්තිය කොටගෙන මහා කාරුණික බුදුරජාණන් වහන්සේ දවස් ගතකළ බව එක්වරම පෙනී යයි.

අලුයම් කාලයෙහි සිංහ සෙය්‍යාවෙන් නැගී සිටින උන්වහන්සේ දවසේ පළමු කටයුත්ත මහා කරුණාවෙන් සමස්ත ලෝක ධාතුවම පරීක්ෂණය කොට බැලීමයි. විපත් දුරුකොට, සැපත් ළඟාකොට කවර නම් පරෝපකාරයක යෙදිය යුතු දැයි උන්වහන්සේ මෙනෙහි කරති. ඒ බුදුරදුන්ගේ දවස අරඹන පළමු සිතුවිල්ලයි. උපකාර අවශ්‍ය අය තමන් වෙත එන තෙක් බුදුරජාණන් වහන්සේ බලා නොසිටිති. උපකාර අවශ්‍ය අය වෙත උන්වහන්සේම වඩිති. මේ නිසා දවසේ ප්‍රථම ගමන අනුන් සොයා යන ගමනකි. තමන්ගේ අවශ්‍යතාවක් ගැන සිතමින් අනුන් අමතක කිරීම, ලෝකය අමතක කිරීම උන්වහන්සේගෙන් නොසිදුවන දෙයකි.

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

මධ්‍යාහ්නය ඉක්මෙන්නට පළමු දවසෙහි එක්ම ආහාරය ගැනීමද බුදුරදුන්ගේ දින චර්යාවෙහි එක් අංගයකි. ඒ සඳහා කිසියම් නැතොත් කිසියම් පුද්ගලයෙකුගේ නිමන්ත්‍රණයක් වේ නම් දන්වූ පසු උන්වහන්සේ එහි වඩිති. නැතහොත් පෙළපිළිවෙළින් පිඬු සිඟා වඩිති. දවසේ ආහාරය සඳහා නියමිත මොහොත එළඹෙන තෙක් ඒ ගැන කිසිවිටෙක සිතුවිලි උන්වහන්සේගේ නැත. කය පැවැත්වීමට අවශ්‍යතාවට සරිලන පමණක්ම ආහාර වළඳති. ආහාරයෙහි ලොල් නැත. මද ආහාර වළඳන බව, අල්ප ආහාර බව උත්සම බුදුගුණයක් හැටියට පෙළෙහි අටුවා දෙක්හිම නිතර නිතර සඳහන්ව ඇත. ආහාරය සම්බන්ධයෙන් ඉතා ගැඹුරු අවධානයක යෙදුණු බව බුදුරදුන්ගේ දින චර්යාව ගැන විමසීමෙහිදී පෙනී යන්නේ.

දිවා භෝජනයෙන් පසු මද වේලාවක විශ්‍රාමයක් ගැනීම බුදුරදුන්ගේ චාරිත්‍රයයි. එය දිවා විහාර නමින් හැඳින්වේ. සමීපයෙහි හැසිරෙන ශ්‍රාවක සංඝයාට කෙටි ධර්ම දේශනා පැවැත්වීම, භාවනා කුම උගැන්වීම, චරිතානුකූල කමටහන් දීම ආදී ශ්‍රාවක සංඝයාගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමද මෙම කාලය තුළම අවස්ථා වේ. ශ්‍රාවකයන්ගේ මහා පැවැත්මේත්, ආධ්‍යාත්මික අභිවෘද්ධියත් සඳහා උන්වහන්සේ කිසිවිටෙකත් වෙහෙසට පත්වූ බවක් නොපෙනේ. ලෞකික, ලෝකෝත්තර සැම භාග්‍යම ශ්‍රාවක සංඝයා සමග සම වූ පරිහරණය කිරීම උන්වහන්සේගේ එකම අභිප්‍රාය විය.

"සන්ධ්‍යා සමයෙහි නිමකරන කටයුතු කිහිපයකින්ම බුදුරජාණන් වහන්සේගේ තුම්වන් දින චර්යාවේ අගය ඉස්මතුව දක්වෙයි. සිව්වනක් පිරිස ඒකරාශීව ධර්ම මණ්ඩපයට වඩින බුදුරජාණන් වහන්සේ චරිතානුකූල ධර්ම දේශනයක් පවත්වති. පිරිසේ මනාකූලතා කිරීමෙන් අවශ්‍ය පුද්ගලයාගේ බුද්ධි ප්‍රබෝධය ඇති කිරීම උන්වහන්සේගේ දේශනාවේ පරමාර්ථයයි. ශ්‍රාවකයන්ගේ සියලු ගැටලුවලට කරුණාවෙන් පිළිසිඳෙන පරිද්දෙන් අපර නොඅඩු වීරිය දරමින් උන්වහන්සේ දෙසති. කෙලෙස නිර්මාණය කරන මිනිස් චරිතය ලොව්තුරා සම්පත්තිම ආශාවෙන් සමන්විතව සදාකාලික ශාන්තියේ ආශිර්වාදයද හිමිකර ගනියි.

සන්ධ්‍යා ධර්ම මණ්ඩපයේ ධර්ම දේශනයෙන් අනතුරුව පළමනායා සඳහාද විය. වේලාවක් ගත කිරීම උන්වහන්සේගේ දින චර්යාවේ අංගයක් වූ බවද පෙනේ. දිය නෑමෙන් පසු එක් සිවුරකින් පමණක් සිව සිරුර වියළමින් සිටි අයුරුද ඇතැම් තැන්වල සඳහන් වේ. එබඳු අවස්ථාවලදී පවා විවිධ ධර්ම කාරණාවන්ගෙන් ශ්‍රාවක සංඝයා ප්‍රබෝධමත් කිරීමට උන්වහන්සේ මැලිකමක් නොදැක්වූහ.


ස්නානයෙන් ශරීරය සැහැල්ලු කරගත් බුදුරජාණන් වහන්සේ චාරිකාව සඳහා සන්ධ්‍යාවෙහි කොටසක් වෙන්කළහ. කායික සුව විනෝදය සඳහා නැත්දැවේ පාගමනින් වඩින උන්වහන්සේ ඝෝෂිතාරාම, කූටාගාරාම, පුබ්බාරාම, නිග්‍රෝධාරාම වැනි ස්ථානවලද ගමන්කොට ඇත්තේ මිනිසුන් සමග සාකච්ඡා කිරීම. පැරණි දන හැඳිනීම ආදියද අවබෝධ කැර ගෙනය. අනාගාමිකයන් සමග උන්වහන්සේගේ පැවැති සම්බන්ධතාවල ස්වරූපය වටහා ගැනීමටද මෙබඳු අවස්ථා අපට ප්‍රයෝජනවත් වේ.

ලලිත කලා කීර්ති, චිත්‍ර කලා ගුරු,
ගොංගිතොට ප්‍රේමරත්න



"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."





# දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර හා බැඳුණු පුද සිරිත් සම්ප්‍රදායන්

වාර්ෂික දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්‍යය ආරම්භ වූයේ කිත්සිරිමේඝවන් රජුගේ (ක්‍රි.ව 301-328) රාජ්‍යත්වයෙන් නව වන වසරේ දළදා වහන්සේ ලක්දිවට වැඩම වීමත් සමඟය. මහාවංශයේ සඳහන් වන පරිදි "රජ පෙනෙණි නව ලක්ෂයක් දක විසඳා දළදා මග පෙරහර කළේය. අවුරුදු පතා අභයගිරි විහාරයට වඩා ගෙන ගොස් දන්ත ධාතුවට මෙබඳු පූජා කරවයි නියෝග කළේය" යන්නෙන් එය සනාථ වේ. මෙම ඓතිහාසික පෙරහර මංගල්‍යය පිළිබඳව ෆාහියන්ගේ සඳහාවන වාර්තාවෙහි "රජතෙමේ (බුද්ධ වර්ෂය අනුව) තුන් වන මස මැද දී (ඇසළ මස) බුදුරජාණන් වහන්සේගේ දළදාව පෙන්වනු ලැබේ. මෙයට දින දසයකට පෙරාතුව කිහිපම විශිෂ්ටම දක්ෂ ඕනිතසු රජ ඇඳුම්, පැළඳුම්, හැඳ පළඳවා, මොනවට සැරසූ ඇතෙකු පිට නගවා, නුවර හැම දෙස බෙර ගසා මෙසේ කියන්ට සලස්වයි." "බෝසතාණන් වහන්සේ අසංඛ්‍ය කපක් මහත් වැර වඩා, පෙරුම් පිරූ සේක. සිය ඇස පහසු නොහැකි සිය රජය ද, සිය බිසව ද, දරුවන් ද, දන් දුන් සේක. තමන් ඇස් උදුල්ලා එය ඉල්ලා ආඩුනට දුන් සේක. අද සිට දස දිනකින් ඒ බුදු රදුන්ගේ දළදාව එළියට වැඩමවා අභයගිරි වෙහෙරට පමුණුවනු ලැබේ. පින් කැමති සියල්ලෝ මග සම කෙරෙත්වා, හොඳින් මහවේ සරසාත්වා. පුද පිණිස මල් හා සුවඳ පිළියෙළ කෙරෙත්වා" යනුවෙන් කෙරෙන විස්තරයෙන් එදවස ඇසළ පෙරහර සංවිධානය වූ ආකාරය කියැවෙයි.

අනුරපුරින් පසු බිහි වූ පොළොන්නරු රාජ සමයේ මහා පරාක්‍රමබාහු රජු විසින්, "රජ ගෙදර පටන් සොදුරන් හැන් මහා අතුල් තලයක් පෙයින් සමතලා කරවා සියලු සතුන්ගේ වැඩෙහි ඇලුණෙ නැම කැතනි සිතියම් දරන්නා වූ ලෝකානන්දයට හේතු වූ තොරන් කරවා, තොරන් යට නාන් කුසුම් එල්ලන විසිතුරු වර්ණ පෙරම්පරා ඇති පුල් වියන් පැළදි බඳවා, තොරන් වැම් එකක් පාසා නාන් වනින් වසා බැඳ ඒ වැම් මුදුනත් ජත්‍ර චාමර පන්තීන් හා නානා ප්‍රූප්‍ර ද, විසිතුරු කොඩියෙන් ද, පුන්කලස් සුදුසු අනාගු දෙපින් ද, සරසා පෙරහර චමත්කාර ලෙස පැවැත්වූහ."

මහාවංශයේ වැඩි දුරටත් විස්තර වන අයුරින් "සියලු ආභරණයන්ගෙන් සැරසුණු ව්ශක, වස් කුළල්, මිහිඳු බෙර ආදිය ගත් ජනයා ද, මිදෙංග බෙරීගත් ජනයා ද මහත් රූප ශෝභාවෙන් යුතුව නානා ගීත වාදනාදියෙන් පූජා කෙරමින්, පෙරටෙහි ගමන් ගත්හ. ඡත්‍ර, චාමර, ධජ පතාකාදිය රැගෙන යන්නෝ ද, ඇත්තු ද, අශ්වයෝ ද ගමන් කළෝය. රජු විසිතුරු ආභරණයෙන් සැරසී ඇතු පිට නැගී ගමන් කළේය. ආකාශ තලය අඳුරු රැසින් බුබුළ කෙරෙමින් මහත් අකාල මේඝයක් ආය. පෙරහර ගමන් කළ මග ඇරුණු නොව වැව පිරී යන තරමට වර්ෂාව පතිත වී වැසි දහරින් ගංවතුර ඇති විය.

දඹදෙණි රාජධානියෙහි ද පෙරහර වාර්ෂිකව පැවැත්විණ. එහිදී පොළොන්නරු යුගයේ පැවැති පෙරහරවත් වඩා උත්කර්ෂවත් ලෙස පෙරහර පැවැත්වූ බව පෙනේ. නොමඳක් පුරා උත්සව පැවැත්වූ බව ද දළදා පෙරහරට අමතරව දේවාල පෙරහරක් ද ඊට එක් වූ බව හෙළිවේ. දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙණියෙහි සිට නමින් උපන් ශ්‍රීවර්ධන නම් නගරය "දිගු පුරෙලින් අඩ යොදුනක් හා ඉක්බිත් පමණ වූ සමතලා වූ මගෙහි පුදු වැලි අතුරවා, ධජ පතාකාදියෙන්, කෙසෙල් ගස් පෙළින්, පුන්කලංකාර දරන චිත්‍ර

කර්මයෙන්, රන් තොරණ, පට තොරණ බැඳවා සියලු අභරණින් සැරසී සිව් රඟ සෙනඟ සමඟ මනාව සරසන ලද රථයක දළදාව වඩා හිඳුවා රන් කොඩි, රිදී කොඩි, රන් සෙමර, රිදී සෙමර, රන් කරඬු, රිදී කරඬු, රනින් රිදියෙන් නිමවන ලද රන් කලස, රිදී කලස යනාදී නා නා විධ පූජා භාණ්ඩයන් පෙරටු කොට පසු පස්සෙහි පංච තූර්යය වාදනයෙන් මහ පුද කෙරෙමින් ධාතුද්වය ශ්‍රීවර්ධනපුරයට වැඩමවා මිනිසුන් ලවා අනේක විධ පූජාවන්ගෙන් දළදාවහන්සේ පිදූහ. ඉක්බිති භික්ෂූන් වහන්සේට දන් දී අට පිරිකරින් පූජා කළේය. තුන්යම් රාත්‍රියෙහි දල්වන ලද පහන් ලක්ෂ ගණනින් පිදුවේය." දඹදෙණියේ දී දළදා පෙරහරට සතර දේවාලයෙහි පෙරහර ද එක් වූ බව දඹදෙණි අස්නෙන් හෙළි වේ. සතර දේවාලයෙහි නටන ගයන පුරවල අය පෙරහරට සහභාගී වූ බව එහි විස්තර වේ.

දඹදෙණි රාජධානියට පසු දළදා වහන්සේ වැඩ සිටි යාපහුව රාජධානියේ ද ඇසළ පෙරහර මංගල්‍යය අලි ඇතුන් හා අසුන් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන්, කොඩි සේසත් චාමර සහිතව නාගය, වාද්‍ය පූජාවෙන් පෙරහර විදී සංචාරය කළ බව සිතා ගත හැකිය.

කුරුණෑගල යුගයෙහි සිව්වන පරාක්‍රමබාහු රජු දවස "නගරය දෙව්පුරයක් සේ සරසා, උතුරුමුව් පයනැත් සිටිනැත්, ගණවැසි කිලිං දෙකුලයෙන් නිස්සන් සමඟ වැඩහුන් කරඬුව හෙදකිලියෙන් මැත් කොට විසිතුරු කොට සරසන ලද රථයෙහි භද්‍රාසනයට වඩා ගණවැසි කිලිං දෙකුලයෙන් දෙන්නකු කරඬුව, වඩා යන ලෙස රථයට නංවා, සුබ ලකුණෙන් යුත් මනා ඇතකු රථයෙහි යොදා ඒ රථය පළමු කොට සුපිළිපත් මහ සඟන පිළිවෙළින් රථයෙහි බැඳි පිරිත් හූය ගෙන පිරිත් කෙරෙමින් වැඩම කළහ. දොරනා වැසි කුලයෙන් නිසි එකකු ලවා රිදී කටාරයෙන් තුවර පිරිත් පැන් ඉස්සවූහ. රථයෙහි දෙපස සිට චාමර හා සේසත් ගෙන ගියහ. දළදාගෙහි ධුරය හා විජේතුන් රථය ගාවා ඉදිරියෙන් ගියහ" යනුවෙන් දළදා සිරිත නමැති පොතෙහි එවකට පෙරහර පැවති ආකාරය විස්තර වේ. දළදා සිරිතෙහි එන පෙරහර චාරිත්‍ර බොහොමයක් අඛණ්ඩව අද දක්වාත් පැවතගෙන එයි.

කුරුණෑගල රාජධානියේ සිට ගඟසිරිපුර රාජධානියට දළදා වහන්සේ වැඩම වූහ. ඉන් පසු දළදා වහන්සේ වැඩම්වූයේ කෝට්ටේ රාජධානියටයි. අනතුරුව කෝට්ටේ රාජධානියෙහි ද දක්වාම දළදා පෙරහරක් පැවැත් වේ. එබැවින් එහි ද එවකට විසිතුරු දළදා පෙරහරක් පැවතිනැ'යි සලකා ගත හැකිය. ඉන් අනතුරුව කෝට්ටේ සිරිපිටියේ දිව්‍යරාළ දළදා වහන්සේගේ රැකවරණය පතා සීතාවක රාජධානියෙහි දෙල්ගමුව රජමහාවිහාරයට දළදාව වැඩමවීය. එහිදී පළමු රාජසිංහ රජතුමාගේ නියමයෙන් රත්නපුර මහසමන් දේවාලයේ වාර්ෂික පෙරහර මංගල්‍යය දළදා පෙරහර පෙරටු කොට ගමන් කිරීමේ චාරිත්‍රය අදටත් අනුගමනය කරයි.

එමගින් සීතාවක රාජධානිය තුළ ද විරාගත සාම්ප්‍රදායානුකූලව ඇසළ පෙරහර මංගල්‍යය පැවැත්වූ බව අනාවරණය වේ.

ක්‍රි.ව. 1592 පළමු වන විමලධර්මසූරිය රජු දවස ශ්‍රී දළදා වහන්සේ සෙංකඩගල පුර රාජධානියට වැඩම වීමෙන් අනතුරුව ද දළදා පෙරහර මංගල්‍යය හෙවත් ඇසළ පෙරහර මංගල්‍යය පවත්වාගෙන ආ බව දක්නා ලැබේ.

මහනුවර යුගයෙහි දෙවන රාජසිංහ රජු දවස සිරකරුවකුව සිටි රොබට් නොක්ස් දුටු පෙරහරේ ඉදිරියෙන් මුඛවාඩම් බැඳ හස්තියකු පිට නැගී කපුරාල කෙනෙකු පට පිළියෙන් මනා සරසන ලද ලීයක් කර තබා ගෙන විදි සංචාරය කොට ඇති බවත්, ජනතාව එයට පුද සත්කාර කළ බවත් විස්තර වේ. ඇතුන් 40 ක් පමණ ද, බෙර දවුල් තම්මැට්ටම් වයන්නවුන් ද, නැට්ටුවෝ ද, මේ පෙරහරේ ගමන් කළහ. ඔහුගේ විස්තරයට අනුව එම පෙරහර දෙවියන්ට කැපවූවක් බව පෙනේ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව 1747 - 1781) සමයෙහි සාමණේරෝපසම්පදාව වැඩම වූ ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ හා ලංකාව වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ හිමියන්ගේ උපදෙසින්, ක්‍රි.ව 1753 දී දළදා පෙරහර පෙරටු කොට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සිව් මහා දේවාල අනුපිළිවෙළට ගමන් ගන්නා ආකාරයට ඇසළ පෙරහර මංගල්‍යය පැවැත්වීම ආරම්භ විය. එතැන් සිට අද දක්වාම මෙම පෙරහර මංගල්‍යය විරාගත සම්ප්‍රදායානුකූලව ශ්‍රී දළදා මාලිගාව පෙරටු කොට පැවැත්වේ.

ජෝන් ඩේවි හා වෙල්ලස්සේ දිසාව දුටු පෙරහර සමයෙහි විස්තරයේ සඳහන් වන පරිදි නගරය දෙව්පුරයක් සේ සරසා තිබුණි. ඒ ඒ නිලයන් හඳුනාගැනීම සඳහා අදාළ කොඩි සහිතව ද, ඇතුන් අසුන් ගණනාවක් ද, විවිධ කොඩි චාමර දරන්නෝ ද, රජයේ නිලධාරීහු ද, කඩු ගත්තෝ ද, පලස් දරන්නෝ ද, හෙල්ල දරන්නෝ ද, කොඩි කන්තාන දරන්නෝ ද, විදෙව්මකයෝ ද, නොයෙක් භාෂාවන්හි නිපුණයෝ ද, ශිල්පීහු ද, ස්ත්‍රීහු ද, ගමන් කළහ. අනතුරුව මහජනයා ද ගමන් ගත්හ. මෙම පෙරහරේ රජතුමා ද මහත් තේජසින් ගමන් ගත්තේය. මෙසේ පෙරහර නගරය ප්‍රදක්ෂිණා කළ අතර ධාතු කරඬුව සරසා මල්වැසි වැස්සවීය.

රජු පන්තිරිප්පුවට පැමිණෙන තුරු රදලවරු හඳුදා නිලධාරීහු හා සෙසු නිලධාරීහු සමඟට ඇති උසස් ඇඳුමින් සැරසී තමන්ට වෙන්වූ කොටස ද රැගෙන සිටිති. රිදී යෂ්ටිය රැගත් අධිකාරම්වරු දෙදෙනා ද, අංකුසය අතින් ගත් ගජනායක නිලමේ ද පැමිණීමෙන් අනතුරුව, රජු පන්තිරිප්පුවේ පෙනී සිටීත්ම ප්‍රශස්ති ගායනා ආරම්භ විය. රජු මහදිකාරම් අමතා ඒ ඒ දිසාවල අය පෙළ ගැසී සිටින්නේදැයි විමසයි. අදිකාරම්වරයා ඒ බව දැන්වූ පසු රජුගේ නියමයෙන් පෙරහර ආරම්භ විණ.

දළදා පෙරහර පැවැත්වීම අරමුණු කීපයක් නිසාම සිදු විය. අතිපූජනීය දළදා වහන්සේට










ගෞරව පූජෝපහාරය පිණිසත්, කලට වැසි ලැබ රටේ සමෘද්ධිය හා සෞභාග්‍ය ඇති කර ගැනීම පිණිසත්, ආධ්‍යාත්මික සහනය හා ශ්‍රද්ධා භක්ති දැක්වීම පිණිසත් පෙරහර පැවැත්වීමේ මූලික අරමුණු වූවා යැයි සලකා ගත හැකිය. පැරණියේ දී පෙරහර පැවැත්වීමත් සමඟ දළදා ප්‍රදර්ශනය කරවීමේ පිළිවෙත ද පැවති... ගැමිය කලාකරුවන්ගේ දක්ෂතා එළි දැක්වීමේ වේදිකාවක් වශයෙන් එහි කලාවන්ගේ උන්නතිය සලසා දක්ෂතා එළි දැක්වීමට ඉඩකඩ සලසා දීම ඇසළ පෙරහර මංගල්‍යය තුළින් ඉටු විය.

දෙස් විදෙස් බොහෝ නරඹන්නන් වාර්ෂිකව මෙම පෙරහර මංගල්‍යය නැරඹීමට පැමිණෙනුයේ, ප්‍රිය විනෝදය සලසා ගැනීමට

"ආශාව නිසා ශෝකය හටගනී, බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. බියකුත් නැත."




තොවූ, එහි පවත්නා විරාගත සම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර සිරිත් මෙම පෙරහර මංගල්‍යය තුළින් ප්‍රදර්ශනය වන නිසාය. විරාගත සම්ප්‍රදායානුකූල පුද සිරිත්වලට අනුකූලව, නවීකරණයෙන් තොරව වාර්ෂිකව පවත්වන මෙවැනි පෙරහර මංගල්‍යයක් ලොව අන් කිසිදු තැනක දක්නට නොමැත.

ඇසළ මාසයේ දී සමස්ත වර්ෂාභාගයේ දී ද පෙරහර මංගල්‍යයට පෙර නගරය පවිත්‍ර කරවා, පිළිසකර කරවා සොබාසමත් කිරීම එදා පටන් අද දක්වා පවතින සිරිතකි. මෙසේ නගරය සරසීමෙන් කොට පුළු සිරිත් පවිදි, පේ කොට තබන ලද 'රසස' වෘක්ෂයේ කැබැල්ලක් ගෙන සතරදේව සිව් දේවාලයන් ප්‍රධාන කොට පූර්වනිමිත්ත ඇසළ කප සිටුවීමෙන් පෙරහැරේ මූලික චාරිත්‍ර ආරම්භ වේ. ඉන් අනතුරුව දේවාල අභ්‍යන්තර පෙරහැර පසක් ද, වීදි සංචාරය කෙරෙන කුඹල් පෙරහර පසක් ද, රන්දෝලි පෙරහර පසක් ද, දිය කැපීමේ පෙරහර හා මධ්‍යම රාත්‍රියෙහි පෙරහර කරඬුව ගෙඩිගේ විහාරයෙහි තැන්පත් කිරීමේ චාරිත්‍රය ද සිදු කරවා, පසු දා දහවල් පෙරහර ගෙඩිගේ විහාරයෙන් ආරම්භව, මාලිගා චතුරශ්‍රය වටා තෙවරක් ප්‍රදක්ෂිණා කරවා යෙදවීම සිරිතය.

පෙරහර ශ්‍රී දන්ත ධාතු මන්දිරයෙන් ආරම්භ වීමට පෙරතුව ගරු දියවඩන නිලමේතුමන් මුල් ඇඳුමින් සැරසී කාර්යාල කාමරයෙහි පෙනී සිටි විට, පෙරමුණ රාළ ගරු දියවඩන නිලමේතුමන්ට ආචාර කොට, පෙරහරේ පළමු ඇතු පිට ගෙන යන ලේකම් මිටිය සහිත රිදී මංජුසාව භාර ගැනීම ද, ගජනායක නිලමේ ස්වකීය නිල ඇඳුමින් සැරසී ආචාර කොට, කුඹල් පෙරහැරේදී නම් රිදී අංකුසයත්, රන්දෝලි පෙරහැරේදී නම් රන් අංකුසයත් භාර ගැනීම ද, කාරියකරවණකෝරාළ ප්‍රමුඛ විදානේවරුන් පැමිණ ආචාර කොට ආශිර්වාද ලබා ගැනීම ද චාරිත්‍රානුකූලව සිදු වේ.

ඉන් අනතුරුව දියවඩන නිලමේතුමන් ප්‍රමුඛ නිලකරුවෝ ගන්ධ කුටිය කරා පිවිසෙති. එහිදී ගරු දියවඩන නිලමේතුමන් සළුන් කිහි සැලින් දෙඅත පිරිසිදු කර ගත් කල්හි පළමුව කාරියකරවණකෝරාළ රන් පට ලේන්සුවක් ද දෙවනුව වට්ටෝරුරාළ තවත් පට ලේන්සුවක් ද ගෙන දියවඩන නිලමේතුමන්ගේ දෙහොත මත එළති. අනතුරුව තේවාභාර නමිබියන් විසින් පෙරහර කරඬුව නිල ඇඳුමින් සැරසී සිටින දියවඩන නිලමේතුමන්ගේ සුරතෙහි තැන්පත් කරනු ලබයි. අනතුරුව කණිකාර මඩුවේ උඩැක්කි, පන්තේරු වාදනය හා දළදා කවි ගයනා සීයාගේ කරඬුව පාවඩ මතින් වැඩමවනු ලබන අතර, පෙරමුණ හා පල්ලේවාහලේරාළ විසින් පුද මල් ඉසිමින් පුෂ්පෝපහාර පවත්වයි. පෙරහර කරඬුව වැඩමවන මංගල හස්තිරාජයා පිට බැඳි රන්කිරීගෙය තුළ පිහිටා පේ කැන්තක් කර පූජ්‍ය පූජා පැවැත්වීමෙන් අනතුරුව කණිකාර මඩුවේ ගායනා මධ්‍යයේ, මහජනතාවට අසලට කරඬුව වැඩමවා, මඳ වේලාවක් නවතා සිට තෙවන වෙඩි හඬ මධ්‍යයේ පෙරහර ආරම්භ වීම සිදු වේ.

ශ්‍රී දළදා මාලිගාවේ පෙරහර පිටත් වන්නේ ඒ පසු පසින් නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන දේවාල අනුපිළිවෙළින් සම්බන්ධ වේ. පෙරහර නියමිත වීදිවල සංචාරය කිරීමෙන් පසු නැවත පෙරහර දළදා මාලිගාවට ගෙනඒමෙන් දිනයේ පෙරහර මංගල්‍යය අවසන් වේ.

අවසන් මහා රන්දෝලි පෙරහර දින මධ්‍යම රාත්‍රියෙහි පෙරහර කරඬුව ගෙඩිගේ විහාරය කරා වැඩමවීම පෙර පටන් පැවත එන චාරිත්‍රයකි. ශ්‍රී දළදා මාලිගාවේ තේවා චාරිත්‍ර පැවැත්වෙන වේලාවන්හි ගෙඩිගේ විහාරයේ දී ද චාරිත්‍ර සිදුවන අතර පෙරහර කරඬුව විහාරයෙහි පුද සත්කාර පැවැත්වීම සිරිතයි. එදින අලුයම් කාලයෙහි සතර දේවාලයන්හි දියකැපුම් පෙරහර ගැටඹේතොට කරා ගමන් කරයි. දිය කැපීමෙන් පසු ආපසු කඩුකැලේ පුල්ලෙයාර් කෝවිල කරා ඇමිණ ආශිර්වාද ලත් පසුව සිය දේවාලයන් කරා පැමිණෙති. දහවල් පෙරහර ගෙඩිගේ විහාරයෙන් ආරම්භව ශ්‍රී දළදා මාලිගා චතුරශ්‍රයෙහි තෙවරක් ප්‍රදක්ෂිණා කරවීමෙන් පසු දියවඩන නිලමේතුමා ප්‍රමුඛ බස්නායක නිලමේවරු සෙසු පෙරහරකරුවන් සහාධිපති මැදුර කරා ගොස් පෙරහර මංගල්‍යය සාර්ථකව පැවැත්වූ බවට සන්නිවේදනය කෙරෙමින් පෙරහර සංදේශය පිළිගැන්වීමේ චාරිත්‍රය ඉටු කරනු ලබයි. පසු දා විෂ්ණු මහා දේවාලයෙහි වලියක් නැටුම පවත්වා පෙරහර මංගල්‍යයට සහභාගී වූ සියලු පිරිසට ඇතුළු සියලු දෙනාට සෙත් ශාන්තිය ප්‍රාර්ථනා කිරීම සිදු වේ. දින පහක් පුරා පැවැත්වෙන මෙම වලියක් නැටුමෙන් පසු ඇසළ පෙරහර මංගල්‍යයේ සියලු චාරිත්‍ර විධි නිම් වේ.


සෙංකඩගලපුර පැවැත්වෙන ඓතිහාසික දළදා පෙරහර නොහොත් ඇසළ පෙරහර මංගල්‍යය දෙස් විදෙස් නරඹන්නන්ගේ නෙත් සිත් ඇද බැඳ ගන්නා විචිත්‍ර වූත්, චමත්කාරජනක වූත් පුද පූජාමය හා සංස්කෘතිකමය මහා මංගල්‍යයකි. දියවඩන නිලමේතුමා ප්‍රමුඛ ප්‍රමුඛතම කාර්යභාරයන් වගකීම් මනා අයුරින් පෙරහර මංගල්‍යය දළදා වහන්සේ විෂයෙහි සිදු කෙරෙන උත්තම පූජාවක් වශයෙන් සාර්ථකව පැවැත්වීමය. එය එදා මෙදා තුර විරාගත සම්ප්‍රදායානුකූලව ඉටු කළ සියලු රජදරුවන්ටත්, ඔවුනු දියවඩන නිලමේවරුන්ටත්, පූර්ව නිලය දැරූ වත්මන් දියවඩන නිලමේ තුමන්ටත්, විරාගත සම්ප්‍රදායානුකූල පුද සිරිත් අඛණ්ඩව පවත්වාගෙන යෑම පිළිබඳව ජාතියේ ප්‍රණාමය හිමි වෙනවා ඇත.

**කේ. මීගහකුඹුර**


"සත්‍ය කිව යුතුය. කෝපය නොකිරිය යුතුය. අල්පය නමුත් ඉල්ලූ කල වියත් ද්‍රව්‍ය දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකු දෙවියන් වෙත යා හැකිය"

දළදා වරුණ


# බෞද්ධ භාවනාවෙන් සිත නිවාගත හැකි බවට සාක්ෂි මෙන්න











භාවනාව යනු බොහෝ ආගම්වල ඉගැන්වෙන්නකි. එසේ වුවද ඒ බොහෝ ආගම්වලින් මේ පිළිබඳ නිශ්චිත පැහැදිලි කිරීමක් කොට නොමැති බැව් පෙනේ. ඒ බොහෝ අවස්ථාවල සිදුවන්නේ ඒ ඒ ආගමික පරමාදර්ශයන් සිහිපත් කොට චිත්ත සමාධියක යෙදීමය. හමුත් බෞද්ධ දර්ශනයේ භාවනාව එසේ නොවේ. එහි භාවනාව පුද්ගල පරාසයන් දක්වා විහිද යන්නකි. එමෙන්ම නිශ්චිත අයුරින් යම් ක්‍රමයක් පිළිවෙළකට විස්තර කොට තිබේ. විවිධ ආගමී ජවනීය භාවනා ක්‍රම පවත්වාගෙන යන මුත්, ලෝකයේ බොහෝ දෙනෙක් නිවැරදි භාවනාව අනුගමනය කිරීම සඳහා බෞද්ධ දර්ශනයේ පිහිට පතාගෙන එන බැව් මෑත ඉතිහාසයේ පැහැදිලිව දක්නට තිබූ දෙයකි. මේ නිසාම බෞද්ධ භාවනා ක්‍රම ලෝකයේ විවිධ රටවල ශීඝ්‍ර ලෙස පැතිර යන්නට පටන් ගෙන තිබේ. මේ ආකාරයට බෞද්ධ භාවනා ක්‍රමය බොහෝ දෙනෙක් අතර පැතිර යන්නට හවත් හේතුවක් වී ඇත්තේ ආගමික පදනමකින් තොරව වුවද මෙය අනුගමනය කරන්නට හැකියාවක් තිබීම නිසාය.

ලෝකයේ බොහෝ රටවල පෙරටුගාමී මෙන්ම මහායාන සම්ප්‍රදායන්ට අයත් භාවනා මධ්‍යස්ථාන දක්නට ලැබේ. ජීවිතයේ විවිධ දුක් කරදර, මානසික පීඩා ඇති බොහෝ දෙනෙක් බෞද්ධ භාවනාව තුළින් සැබෑ සහනයක් අත්කොටගෙන ඇති බව පැහැදිලිව පෙනෙන්නට ඇති දෙයකි. භාවනාව නිවැරදිව වැඩීමේදී සිත සන්සුන් කරන්නට හේතුවන හෝර්මෝන නිකුත් වන බවද සොයාගෙන ඇත.

ලෝකයේ ප්‍රමුඛම පුද්ගලයන් බොහෝ දෙනෙක් බෞද්ධ භාවනා ක්‍රමය තුළින් සැබෑ සහනයක් ළඟා කරගෙන ඇති බැව් විවිධ පුවත්වලින් අසන්නට ලැබේ. මෙයද බෞද්ධ භාවනා ක්‍රමය ලෝකයේ වේගයෙන් පැතිර යන්නටත් මානසික සුවය පතා එම භාවනා ක්‍රමය අනුගමනය කරන්නටත් බොහෝ දෙනෙකු තුළ නැඹුරුවක් ඇති වන්නට එක් හේතුවක් වී තිබේ.

මෑතකදී මිය ගිය ඇපල් පරිගණක සමාගමේ සිටි ප්‍රධාන නිලධාරියා වූ ස්ටීව් ජොබ්ස් බුදු දහම සහ බෞද්ධ භාවනා ක්‍රමය ඔහුගේ ජීවිතය පිළිබඳ අලුතින් සිතන්නට පටන් ගත් බව ප්‍රවෘත්තියක් ලෙස ලෝකයේ පැතිර ගියේය. ඔහු ඒ පිළිබඳව මෙසේ පවසා තිබිණි.

'ඔබ විනාඩි හතර වෙලා නිරීක්ෂණය කරලා බැලුවොත් පෙනේවි ඔබේ සිත කොයිතරම් නම් කලබලද කියලා. ඔබ ඒ සිත සන්සුන් කරන්න උත්සාහ කළොත් එය කොයිතරම් නම් අමාරුද කියලා තේරෙයි. ඒත් ටික දවසක් උත්සාහ කරන කොට සිත සන්සුන් වෙන බව ඔබට දැනෙන්න පටන් ගනීවි. ලෝකයේ අපට මෙතෙක් නොඇසුණු, නොදැනුණු බොහෝ සියුම් දේ ඇති බව අපට සිතේවි. දැන් ඔබට ඔබේ ජීවිතය වගේම ලෝකයත් වෙනදටත් වඩා පැහැදිලිව දකින්න පුළුවන් කියලා දැනේවි. මෙන්න ඇත්තටම සිත නිශ්චල වීම හැකියාව. මෙය ඔබ විසින් අත්හදා බැලීමෙන් පමණයි අවබෝධ කරගත හැක්කේ.'

මේ ප්‍රකාශය ඇත්තේ ස්ටීව් ජොබ්ස්ගේ ජීවිත කතාවේය. බෞද්ධ දර්ශනය හා භාවනා ක්‍රමය ඔහුගේ ජීවිතය අලුතින් ආරම්භ කළ ඔහු ඇපල් සමාගමේ නව නිර්මාණ රැසකටම දායක විය. මේ සමඟ ලෝකයේ බොහෝ දෙනෙක් බෞද්ධ භාවනා ක්‍රමය පිළිබඳ පෙර නොවූ විරූ අයුරින් සිය අවධානය යොමු කරන්නට පටන් ගත්හ.

ලෝකයේ අංක එකේ ගොල්ෆ් ක්‍රීඩකයා ලෙස නාමයක් කිරුළ පැළඳ සිටින්නේ ටයිගර් වුඩ්ස්ය. ඔහුද බෞද්ධ භාවනා ක්‍රමය ජීවිතයට ආදේශ කරගත් අයෙකි. බොහෝ දෙනෙකු නොදන්නා කරුණක් වුවද ඔහු උපතේ සිටම බෞද්ධ ආගමයෙන් හැදුණු වැඩුණු අයෙකි. හමුත් ඔහු ඒ පිළිබඳව දැඩිව සිතන්නට පටන්ගෙන ඇත්තේ ගොල්ෆ් ක්‍රීඩාවෙන් ලෝක ප්‍රසිද්ධ වීමෙන්ද අනතුරුවය.

'බෞද්ධ භාවනා ක්‍රමය තුළින් මට මගේ ආධ්‍යාත්මික ජීවිතය, පවුල් ජීවිතය වගේම , වෘත්තීයමය ජීවිතයත් නිවැරදිව හැඩ ගස්වාගන්නට පුළුවන් වුණා. මේ සේරටම මුල් වුණේ භාවනාවෙන් ලැබුණු මානසික සංහිඳියාවයි. කුඩා වියේ දීද සිය මව සමඟ බෞද්ධ විහාරස්ථානයට යාමේ පුරුද්දක් ඇතිව සිටි ටයිගර් වුඩ්ස් භාවනා ක්‍රමයට සිය සිත යොමු කරවීමේ ගෞරවය හිමිකර දෙන්නේද සිය මවටය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**පූජ්‍ය, ආචාර්ය බමුණුගම ශාන්ත විමල හිමි**


''යකඩයෙන් හැඟුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගාව
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridaladamaligawa.lk


## යහපත් සමාජ වටපිටාවක් ගොඩනගමු


[illegible]



# ඔබ කියන අසන පිරිත

[illegible]





ප්‍රනීත් අභයසුන්දර

"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි ඇති කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# අර්බුද නැති යුග දිවියක් සඳහා බුදු දහමින් උපදෙස්

යුග දිවියකට පත්වීම ස්ත්‍රී - පුරුෂ ප්‍රේමයේ ඉතාම වැදගත් සන්ධිස්ථානයකි. ගිහියන්ගේ සරණ බන්ධනයට බුදු දහමින් බාධක තහංචි පැණවෙන අතර සර්ව සම්පූර්ණ යුග දිවියක් සඳහාද බුදු දහමින් උපදෙස් සැපයෙයි. නමුත් අද සමාජයේ බොහෝ විවාහ ජීවිතවල දකිය හැකි වන්නේ බොහෝ ගැටලුකාරී තත්ත්වයන්ය. මේ නිසාම ඇතැම් අය විවාහ වීමට බියවන අවස්ථාද නැතිව නොවේ. මෙසේ ගැටලු ඇතිවීමට හේතු මොනවාද? මේ පිළිබඳව අපි විමසා බලමු.

**විවාහ ජීවිතයේ අත්‍යවශ්‍යම පතිවත හා පතිනිවතයි**

"පතිවත" යනු බිරිඳ තම සැමියා කෙරෙහි විශ්වාසවන්තව තම සැමියා හැර වෙනත් පිරිමින් කරා නොයා කටයුතු කිරීමය. "පතිනිවත" යනු සැමියා තම බිරිඳ හැර වෙනත් කාන්තාවන් කරා නොගොස් බිරිඳට විශ්වාසවන්තව කටයුතු කිරීමය. සැමියා සහ බිරිඳ එකිනෙකාට විශ්වාසවන්තව, අවංකව කටයුතු කිරීම සාර්ථක පවුල් ජීවිතයකට ඉතාම අවශ්‍ය වන අතර "සැකය" යනු පවුල් ජීවිතවල ගැටුම් ඇති කරන ප්‍රධානම කාරණාවයි. එම නිසා දෙදෙනා දෙදෙනාට විවෘතව, විශ්වාසවන්තව කටයුතු කිරීම පවුල් ජීවිතයේ ආදරය, සතුට ආරක්ෂා වීමට හේතුවන බව කිව යුතුමය.

**සැමියා හා බිරිඳ ඔවුනොවුන් හොඳින් හඳුනාගත යුතුය**

විවාහ ජීවිතයක් සාර්ථක වීමට සැමියා හා බිරිඳ ඔවුනොවුන් හඳුනා ගැනීම හා ඔවුනොවුන්ගේ අදහස්වලට ගරු කිරීම ඉතාම වැදගත්ය. අතෙහි ඇඟිලි පහ පස් ආකාර වනවා සේ මිනිසුන් තුළද එකම අදහස් ඇති, එකම රුචිකත්වයක් ඇති දෙදෙනකු සොයා ගැනීම පහසු නොවේ. එම නිසා සැමියා හෝ බිරිඳ තමාගේ අදහස්වලට සියයට සියයක්ම එකඟ විය යුතු යැයි සිතීමද නිවැරදි වන්නේ නැත.

අප රටේ සංස්කෘතිය අනුව බොහෝ බිරින්දෑවරු සියයට හැත්තෑ පහක්ම (75%) සැමියාගේ රුචිකත්වය අනුව කටයුතු කරති. සියයට සියයක්ම (100%) මෙම තත්ත්වය ඇතිකර ගැනීමට උත්සාහ කිරීමත් පවුල්වල ගැටලු ඇතිවීමට හේතුවකි. එයින් මතුවන්නේ සාමූහික ජීවිතයක් නොව ඒකාකාරී තත්ත්වයකි. එවැනි තත්ත්වයක් තුළ ඇත්තේ ආදරයක් නොවේ. නමුත් පවුල් ජීවිතයක් යනු ඒකාධිකාරී බලයක් මෙහෙයවනු ගත යුතු තැනක් නොවන බවත් සාමූහිකව ජීවිතයේ දුක-සැප දෙක විඳ දරාගෙන දෙදෙනා ආදරයෙන් කටයුතු කළ යුතු තැනක් බවත් අවබෝධ කරගැනීම ඉතාම අවශ්‍ය වේ.

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

## සිඟාලෝවාද සූත්‍රයේ ඉගැන්වීම්

බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේදී සැමියාගෙන් බිරිඳටත්, බිරිඳගෙන් සැමියාටත් ඉටුවිය යුතු යුතුකම් පහ බැගින් පෙන්වා දී තිබේ. නමුත් පවුල් ජීවිතවල ආරවුල් ඇතිවන අවස්ථාවලදී මේවා පිළිබඳව සිහිපත් කර කටයුතු කරන අය ඉතා අල්පය. එවැනි අවස්ථාවලදී බොහෝ දෙනකු කරන්නේ ගිනි ගත් ජීවිතයට දිය පොදක් සොයාගෙන එහා මෙහා දිව යාම නොවේද? එසේ ගොස් අනර්ථ දේ සිදු කර තමන් ළඟ ඇති මිල මුදල් පවා නැති නාස්ති කරගත් අය නොමැත්තද? එපමණක් නොව විසඳුම් සොයා ගැනීමට දරන උත්සාහයන්වලදී තම පවුල් ජීවිතයේ ඇවිළෙන ගින්නට පිදුරු එක්කර ගත් අවස්ථාද තිබුණා නොවේද?

## සැමියාගෙන් බිරිඳට ඉටුවිය යුතු යුතුකම්

1. බිරිඳට ගරු කළ යුතුය.
2. ඇයට නින්ද අපහාස නොකළ යුතුය.
3. බිරිඳ හැර වෙනත් ස්ත්‍රීන් සමඟ ලිංගික ඇසුරක් නොපැවැත්විය යුතුය.
4. සම්පත් ඇයට පැවරිය යුතුය.
5. ඇඳුම් පැළඳුම්වලින් ඇයට සංග්‍රහ කළ යුතුය.

ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ බිරිඳ සැමියාගේ උපරිම ආදරයට, ගෞරවයට ලක්විය යුතු බවය. අන් අයගේ ආදරයට, ගෞරවයට ලක්වීමට ඕනෑම පුද්ගලයකු කැමති බව මනෝ විද්‍යාඥයන්ගේද මතය වේ. එම නිසා බිරිඳට ඇගයීම ඉතාම අවශ්‍ය බවත් එසේ සිදු නොවීම පවුල් ජීවිතයේ ගැටලු ඇතිවීමට හේතුවන බවත් සැමියන් විසින් මතක තබා ගත යුතු වේ.

## බිරිඳගෙන් සැමියාට ඉටුවිය යුතු යුතුකම්

1. නිවසේ කටයුතු මැනවින් ඉටුකළ යුතුය.
2. සැමියාගේ පිරිවර ජනයාට (ඥාතීන් මිතුරන් ආදී) මැනවින් සංග්‍රහ කළ යුතුය.
3. වෙනත් පිරිමින් ඇසුරු නොකළ යුතුය.
4. සැමියා උපයන වස්තුව මැනවින් ආරක්ෂා කළ යුතුය.
5. සියලු කටයුතුවලදී සුහුසුළුව ක්‍රියා කළ යුතුය.

බිරිඳ ඉහත කරුණු අනුව කටයුතු කරන විට සැමියාගේ ආදර ගෞරවය ලබාගැනීම අපහසු වන්නේ නැත. නිවසේ කොයිතරම් සේවකයන් සිටියද වැදගත් වන්නේ සැමියාගේ වැඩ කටයුතු සියල්ල බිරිඳ අතින් ඉටු කිරීමය. දෙදෙනා අතර ආදරය, බැඳීම වර්ධනය කරගැනීමට, පවුල් ජීවිතයේ ගැටලු ඇතිවීම වළක්වා ගැනීමට එය මහත් සේ උපකාරී වේ.

මහගම සේකර කවියා මේ පිළිබඳව පෙන්වා දී ඇත්තේ මේ ආකාරයෙනි.

"පාන්දරින් තේ උගුරක් මට ගෙනෙන බිරිඳ ඔබය. දූ පුතුන් ආදරයෙන් රැක බලනා බිරිඳ ඔබය. හිත් සිරුවේ මා ගැන සෝදිසියෙන් සිටින ඔබය. මාත් එක්ක සංසාරේ එකට සිටිය බිරිඳ ඔබය. දුර ගමනක් ගිය විට මඟ බලා සිටින බිරිඳ ඔබය. කරබාගෙන ඇනුම් බැණුම් අසා සිටින බිරිඳ ඔබය. නරකාදිය තුළ සුරපුර උදාකරන බිරිඳ ඔබය. මරණින් මතු සංසාරේ එකට සිටින බිරිඳ ඔබය."

බුදුරජාණන් වහන්සේ[illegible] ආදරයෙන් යුක් පිරිසිදු පවුල් ජීවිතය අගය කළ [illegible] මාතා පිතු දෙපළට ඊළඟ භවයේදීත් යහපත් අඹු-සැමියන ලෙස ඉපදීමට අවශ්‍ය මඟ පහදා දීම ඒ සඳහා උදාහරණයකි. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ ඒ සඳහා 'සීලය, පරිත්‍යාගය, ශ්‍රද්ධාව, ප්‍රඥාව' යන ගුණ හතර සම ලෙස දෙදෙනාම පුහුණු කළ යුතු බවකි. ඔබත් මේ වටිනා ඉගැන්වීම් සිතට ගන්න. ඔබගේ පවුල් ජීවිතය ආදරය, සතුට පිරුණු තැනක් කරගන්න. එවිට ඔබට ජීවත් වීමට ආසා හිතේවි.



කිරිබත්ගොඩ ශ්‍රී ධීරානන්ද විද්‍යායතන පිරිවෙණේ ආචාර්ය,
ශාස්ත්‍රපති කොටියාගල සීවලී හිමි

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - වීනීල ජාතකය"

# නිරෝධ සමාපත්තිය යනු මොකක්ද?

චිත්ත චෛතසික ඇති නොවීම සම්පූර්ණයෙන්ම නතර වුණු අවස්ථාව තමයි නිරෝධ සමාපත්තිය කියන්නේ. එය විස්තර කරන්නේ මෙහෙමයි.


සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ ධ්‍යානයක් නොලැබූ මිනිසාගේ සිත කාම වස්තු කෙරෙහි ගැටී පවතින්නේ රූපයත්, ශබ්දයත්, ගඳත්, සුවඳත්, රසයත් ගැනය.

යම්කිසි අරමුණක ඒවා ඇලිලා කාම ලෝකයේ සාමාන්‍ය මනුෂ්‍යයාගේ සිත් ඇතිවෙච්ච යන්නේ අරමුණක් නැතිව සිත හැදෙන්නේ නැහැ. අරමුණ කියන්නේ සිත එල්ලෙන දේ. රූපයක නැතිනම් ශබ්දයක ඒ විදියට සිත ඇලෙනවා.

ඉතින් එහෙම හැදෙන සිත්වලට අප කියනවා කාමාවචර සිත් කියලා.

කෙනෙක් ධ්‍යාන භාවනා කරනවා නම් සිත බැඳී තිබෙන කාම වස්තූන්ගෙන් ඉවත් කිරීමේ බලාපොරොත්තුවෙන්.

උදාහරණයක් වශයෙන් කියනොත් සිත එකඟ කරන භාවනා ක්‍රම කසිණයක් තිබෙනවා. ඒවායින් සාදු භාවනාව පුරුදු කරන තැනැත්තා මැටිවලින් සාදූ පටනකක්, එහෙම නැත්නම් ජලය පුරවන ලද කට පළල් භාජනයක් දෙස හෝ එහෙමත් නැත්නම් එළියක් දිහා බලමින් සිත එකඟ කරනවා. එහෙම



වුණාම අනික් සියලුම දේ අත්හැරලා සිතට පේන එම ද්‍රව්‍ය කෙරෙහි සිත ඇලිලා පවතිනවා. ඉතින් මේ ක්‍රමය පුරුදු කරාම එහිම සිත රැඳෙනවා. අන්තිමේදී ඒක සිතට පෙනෙන්ට වෙනවා. ඊට පස්සේ ඒ සිත එකඟ කිරීමට යොදා ගත් දේ අතහැරලා යොදාගත් සටහන දිහා සිතෙන් බලනවා.

දන් මෙතෙනදි සලකන්න ඕන, මුලින්ම සාමාන්‍ය මිනිහෙක් දිහා බලන දේවලට වඩා මේ ධ්‍යාන භාවනාවලට ගත් අරමුණට නැමුණු සිත ගොරෝසුකමින් අඩුයි. ඉතින් ඒක දිහා බලාගෙන ඉන්න කොට ඒකේ සටහන සිතට පෙනෙන්න වුණාම සිතට පෙනෙන අරමුණ නැවත සිතින් බලමින් ඇතිවන සිත අර සියලුම සිත්වලට වැඩිය සියුම්. අර මුලින් ඇති වූ ගොරෝසු ගතිය එහි නැහැ. දන් ඉතින් අර හරියට පෙනෙන අරමුණු දිහා සිතින්ම බලමින් ඒ අරමුණෙහිම සිත පිහිටුවමින් ඒ පිළිබඳවම සිත එකඟ කරමින් ටික කලක් ඉන්න විටදී රාගාදී කිසිම ක්ලේශයක් නැති නිසා ඒ සිත බොහෝ දුරට පිරිසිදු වෙලා. ඒ නිසාම සිතට පෙනෙන අරමුණක්, එළියක් පෙනෙන්න වෙනවා. දන් සිතට පෙනෙන එළිය කෙරෙහි තදින් සිත බඳිනවා. අන් සියල්ලම අමතක කරලා එහිම සිත බැඳලා තැය ගණින් ඉන්නට ඔහු පුරුදු වෙනවා.

ඒ තත්ත්වයෙන් ඉන්න විට ඔහුට වටපිටාවේ කිසිම දෙයක් ඇහෙන්නේ, දනෙන්නේ, පේන්නේ නැහැ. ඔහුගේ සිත අර ආලෝකයේ බැඳිලා ඒ දිහාම බලමින් ඉන්න නිසා වෙන කිසිම ක්ලේශයකට බැඳෙන්න ඉඩක් නැහැ. මොකද අරමුණ අර එළියෙහි බැඳිලා තියෙන නිසා.

දන් ඒ සිතට පේන එළිය ටික ටික ලොකු වෙන්න කියලා සිතා ගන්නවා. එහෙම සිතාගෙන ඒ තැනම සිත බැඳලා පවත්වන කොට ආලෝකය විශාල වෙන්න පටන් ගන්නවා.

එතැන එන්නේ එළියක් ලොකුවීමක් නොවේ. සිතේ පරිකල්පනයක්.

මම නිදර්ශනයක් කියන්නම්. ලියකට ඇණයක් ගැහුවොත් තදින් ඒ ඇණය ලීයෙහි කාගෙන හෙල්ලෙන්නේ නැතිව තදින් පවතිනවා.

අන්න ඒ වගේ අර සිතට පේන එළියෙහි සිත කාගෙන ගොසින් සිත බැඳිලා හෙල්ලෙන්නේ නැතුව එළිය දෙස බලමින් සිත පවතිනවා. සිතට පේන එළිය වට්ටියක් කුල්ලක් ප්‍රමාණයට ලොකු වුණාම කලින්ට වඩා එහි සිත තදින් බැඳී පවතිනවා. ඔහු කැමති ඒ විදියට තවත් විශාල කරගන්න පුළුවන්.

යම් තරම් දුරට සිතේ එකඟකම දියුණු වුණාම සිතේ කාමාදී කෙලෙස් බොහොම ඈත් වී යනවා. විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතා කියන ප්‍රධාන අංග පහ සිතේ තදින් වැඩ කරනවා. මය අංග පහෙන් යුක්ත වෙන කොට ක්ලේශයන් බොහෝම යටපත් වෙනවා.

මේ අවස්ථාවට අපි කියනවා පළමුවන රූපධ්‍යාන අවස්ථාව කියලා. මේ අවස්ථාවේදී සිත කලින් හටගත් සිතිවිලිවලට වඩා හුඟක් සියුම්. කලක් අරමුණෙහි සිත හොඳට පුරුදු කරන කොට අර විතර්ක නමැති සිතේ අරමුණු ඕනකමක් නොවන අවස්ථාව නැතිව ඊතැම විවේකයකදී කෙසේ වනවිට ආලෝකයට ගැටිලා සිත ඇතිවෙන්න

23 පිටුවට ▶

පටන් ගන්නවා. මේකට කියනවා පළමුවන රූපධ්‍යාන අවස්ථාව කියලා. තවදුරටත් ඒක හොඳට සිතට පුරුදු වුණාම අර විතර්ක කියන අංග විචාර, ප්‍රීති, සුඛ ඒකාග්‍රතා නැති අනික් අංග අතරින් සිත ඇතිවෙනවා. සිතේ එළිය නැවත නැවත පිහිටුවමින් එය උත්සාහ කරන කොට අර විචාරයත් නැතිව ප්‍රීති සුඛ ඒකාග්‍රතා යන අංග තුනෙනුත් සිත ඇතිවෙනවා. ඒ සිතින් එළිය දිහා බලමින් කලක් ඉන්න කොට ප්‍රීතිය නැතිව සුඛ ඒකාග්‍රතා කියන අංග දෙකින් යුක්තව සිත ඇතිවෙන්න පටන් ගන්නවා.


ඔය ක්‍රමයට සිත එකඟ කරන කොට සුඛ වේදනාව නැතිව ඒ වෙනුවට උපේක්ෂා (මධ්‍යස්ථ බව) ඇතිව සිත ඇතිවෙන්න පටන් ගන්නවා. එය එකඟතාවේ ඉහළට ගිය පස්වැනි අවස්ථාවයි. ඒ තත්ත්වයෙන් පවත්නා සිත කලින්ට වඩා බොහෝම සියුම්. සිතේ ගොරෝසු ගති අඩුවෙලා. පංචමධ්‍යාන සිත යනුවෙන් එය හඳුන්වනවා.

එම තත්ත්වයෙන් ඉන්න තැනැත්තා මගේ සිත එළියක් කෙරෙහි බැඳිලා පවතින්නේ මේකත් ගොරෝසුයි. මීට වඩා සිත සියුම් කළ යුතුයි කියා සිතනවා. එහෙම සිතලා සිතට පෙනෙන මනෝමය ආකාසයෙහි හැමතැනම පැතිරෙන්න කියලා.

මෙසේ ටික දවසක් උත්සාහ කරන විට තමාගේ බලාපොරොත්තුව හරි යනවා. මනෝමය ආකාසේ එළිය හැමතැනම පැතිරීලා පේන්න වෙනවා. තමා ඇතුළතත් තමාගේ පිටතත් දැන් ඇත්තේ එළිය. ඒ අපුරින් මතුව පේන්නේ. දැන් ඉතින් එයා අධිෂ්ඨාන කරනවා මේ අනන්තව පැතිර යන කසිනාලෝකය අතුරුදන් වේවා කියා නොපෙනී හිස් අහස පමණක් පෙනේවා කියලා. මෙසේ ටික දිනක් උත්සාහ කරන කොට ඒ අදහස හරි යනවා.

සිතට අර එළිය නොපෙනී හිස් අනන්ත ආකාසය විතරක් පේන්න වෙනවා. කලින් තිබූ කසින එළියෙන් ඉවත් කිරීමෙන් පෙනෙන්නා වූ අහසයි ඒ. දැන් අනන්ත වූ හිස් අහස ඉතාම සියුම් අරමුණක්. ඒ අරමුණෙහි බැඳුණු සිත් අනික් සිත්වලට වඩා සියුම්. දැන් අරමුණ සියුම් වෙන්න වෙන්න සිතත් සියුම් වෙනවා. මේ අනන්ත ආකාසයෙහි බැඳී පවත්නා සිතට ආකාස අනන්තායතන සිත යනුවෙන් නම් කරනවා.

**බලන්ගොඩ ආනන්ද මෛත්‍රී නාහිමියන්ගේ දේශනාවක් ඇසුරින් උපුටා ගන්නා ලදී**



# ජය පිරිත

ශ්‍රී ධිති මති තේජෝ ජයසිද්ධි මහිද්ධි මහා ගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස, භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.


ද්වත්තිංස මහා පුරිසලක්ඛණානුභාවේන, අසීත්‍යානුබ්‍යඤ්ජන ලක්ඛණානුභාවේන, අට්ඨුත්තරසතමංගල ලක්ඛණානුභාවේන, ඡබ්බණ්ණ රංසානුභාවේන, කේතුමාලානුභාවේන, දසපාරමිතානුභාවේන, දසඋපපාරමිතානුභාවේන, තේජානුභාවේන, ඉද්ධානුභාවේන, බලානුභාවේන, ඤෙය්‍යධම්මානුභාවේන, චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානුභාවේන, නවලෝකුත්තරධම්මානුභාවේන, අට්ඨංගිකමග්ගානුභාවේන, අට්ඨසමාපත්ත්‍යානුභාවේන, ඡලභිඤ්ඤානුභාවේන, මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛානුභාවේන, සබ්බපාරමිතානුභාවේන, රතනත්තය සරණානුභාවේන, තුය්හං සබ්බරෝග සෝක උපද්දව දුක්ඛදෝමනස්සුපායාසා විනස්සන්තු, සබ්බසංකප්පා තුය්හං සමිජ්ඣන්තු දීඝායුකෝ හෝතු සතවස්සජීවේන සමංගිකෝ හෝතු සබ්බදා-

ආකාස පබ්බත වනභූමිතටාකගංගා මහාසමුද්දආරක්ඛික දේවතා සදා තුම්හෙ අනුරක්ඛන්තු, සබ්බ බුද්ධානුභාවේන, සබ්බ ධම්මානුභාවේන, සබ්බ සංඝානුභාවේන, බුද්ධරතනං, ධම්මරතනං, සංඝරතනං, තිණ්ණං රතනානං ආනුභාවේන, චතුරාසීති සහස්සධම්මක්ඛන්ධානුභාවේන, පිටකත්තයානුභාවේන, ජිනසාවකානුභාවේන සබ්බේ තෙ රෝගා, සබ්බේ තෙ භයා, සබ්බේ තෙ අන්තරායා, සබ්බේ තෙ උපද්දවා, සබ්බේ තෙ දුන්නිමිත්තා, සබ්බේ තෙ අවමංගලා විනස්සන්තු -

ආයුවඩ්ඪකෝ, ධනවඩ්ඪකෝ, සිරිවඩ්ඪකෝ, යසවඩ්ඪකෝ, බලවඩ්ඪකෝ, වණ්ණවඩ්ඪකෝ, සුඛවඩ්ඪකෝ, හෝතු සබ්බදා -

දුක්ඛරෝගභයාවේරා - සෝකා සබ්බේ උපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තුච තේජසා
ජය සිද්ධි ධනං ලාභං - සොත්ථිභාග්‍යං සුඛං බලං
සිරි ආයු ච වණ්ණො ච - භොගං වුද්ධි ච යසවා
සතවස්සා ච ආයූ ච - ජීවසිද්ධිභවන්තු තේ
මේ පිරිත සියලු රෝගයන්ටද, යක්ෂයන්ට හා ග්‍රහ දෝෂවලටද යහපති.

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"



# මෙත් වඩන සැවොමා සුවසේ නිදයි සැමදා

සව් ලෝ සතුන් වෙත මෙත් සිතැත්තේ සොම්නස වේ. නැමිවිට ඔහු ප්‍රිය වේ. මිනුගේ සෙවණ සීතලය. සත් හැවිරිදි රාහුල කුමරුන් බුදුරජාණන් වහන්සේගේ මුව දෙස බලා ලද සොම්නස බසින් "සුඛතෙ සමණ, සමණ" යනුවෙන් "මහණ ඔබවහන්සේගේ සෙවණැල්ලද මට සැප යයි" ප්‍රකාශ කළේ එහෙයි. එබැවින් සවුලෝ සතුන් වෙත මෙත් සිතින් බලනු මැනවි. තරහ සිත නැතු කල්හි තරහකරුවෙකු නැතුවා වෙති. තරහකරුවා පෙනෙන්නේ තරහ සිතටය. මෛත්‍රිය පුරන්නකුට තරහකාරයෝ නොවෙති." "අසවලා මට බැන්නේය, ගැසුවේය, නින්දා කළේ" යැයි මිනිසුන් ගැන සිතා වෛර කිරීම තම සිතට වේදනාවකි. එය සිතට බර පැටවීමක් වැනිය. වෛර සිත වැඩි වීමට වඩා නැතිම කොතරම් මිහිරක්දැයි සිතනු මැනවි.

### ප්‍රිය වචන

සිතින් මෙන්ම වචනයෙන්ද අනුන්ට හිංසා නොකළ යුතුය. තද වචන සමහර විට ගිනි පාරකටත් වඩා දරුණුය. තමන්ට යමක් අමිහිරි නම් අනුන්ටත් එය එසේම අමිහිරිය. මුවින් පිටවෙන වචන තෙවැදෑරුම්ය. "මධුභානී, පුප්ඵභානී, ගූථභානී" යනුයි. මී වැනි ප්‍රිය වචන කතා කරන්නේ මධුභානී නම් වේ. මල් වැනි ලස්සන වචන කතා කරන්නේ පුප්ඵභානී නම් වේ. අසූචි වැනි ගඳ ගහන වචන කතා කරන්නේ ගූථභානී නම් වේ.

"ප්‍රිය වාචමේව භාසෙය්‍ය - යා වාචා පති නින්දිතා
යං අනාදාය පාපානි - පරේසං භාසතේ පියං"

වචනයක් ඇසුණ විට සතුට උපදවන්නේ එවැනි වචනයක්ම කිව යුතුය. අසන්නාගේ යහපතට හේතුවන වචන කතා කළ යුතුයි. සිතල භාජනයකට දමන සිසිල් පැන් වැනි වන්නේය. එමෙන්ම මිදු මොලොක් ප්‍රිය වචන කතා කිරීමට පුරුදුව සිටින්නකුට ඇතිවෙන ශෝභාව වතා තිබී යන්නේය. රළු වචනය සිත දෙදරා යන තිඹිසි පහරකි. බොරු කියා, කේලාම් කියා, පරුෂ වචන කියා වාද භේද ඇති කිරීමෙන්, අනුන්ට නින්දා කොට ඔවුන්ගේ චරිතය කිළිටි කිරීමත් හිංසාවකි.

ඇත්තක් වුවද කීමෙන් හානියක් සිදුවේනම් නොකියා ඉඳීම මැනවි. පිවිතුරු ශාන්ත වචනය වුවද අනවශ්‍ය තැනට යෙදීම අහිතකරය. අශෝභනය. මුවගට ආ තරමට වචන පිට නොකර දුරදිග බලා කල්පනාකාරීව මල් වැනි සුවඳැති වචනත්, මධු වැනි රසැති වචනත් කතා කිරීමට පුරුදු විය යුතුය.


### මෙත් වැඩීම

සිතිනුත්, වචනයෙනුත් යන දෙකටම වඩා හිංසාව සිදුවන්නේ ක්‍රියාවෙනි. එබැවින් ඔබේ සතර ඉරියව්වම අනුන්ට හිංසාවක් නොවන පරිදි පැවැත්විය යුතුය. කිසිවකුටවත් තැලීම් පෙලීම් ආදියෙන් කිසිවිටකත් හිංසා නොකරන්නට සිතාගත යුතුය. ගෙදර සිටින අසරණ මෙහෙකරුවන්ට හිංසාව වෙනුවට ආදරය, කරුණාව දක්වන්න. පමණට වඩා වැඩ නොගන්න. පවුලේ අය මෙත් සිතා පිළිපදින්න. කුඩා දරුවන්ද අසරණ සතුන්ට ආදරයෙන්, සෙල්ලමටවත්, තරහෙන්වත්, අතින් පයින් හෝ දඬු මුගුරු ආදියෙන් හිංසා නොකරන්න. සතුන් මැරීම, මැරවීම, මැරවීමට අනුබල දීම, හිංසා කිරීම බලවත් පාපයකි. දඟවත් තරුව ගැන ඔබ අසා ඇත. එය අලුයම කාලයෙහි අහසේ පායයි. සියලු තරු පරදවා පායන්නකි. මෙත් සිත් ඇති වූයේද දඟවත් තරුව මෙන් බබළන්නේය. තරත් චන්ද්‍රයා සියලු තරු අභිබවා අහසේ බබළන්නේ යම් සේද මෙත් සිතැත්තේද සදේවක ලෝකයා අතර ප්‍රිය මනාපයට බබළයි. මෙත් වැඩීම සතුරන් මිතුරු කරගැනීමට ප්‍රබල ආයුධයකි. පෙර පැලලුප් නුවර වැසි විශාඛ නම් එක්තරා කෙළෙම් පුත්‍රයෙක් ලක්දිව බුදු සසුන බැබළෙන බව අසා අනුරාධපුර මහා විහාරයට පැමිණ පැවිදි විය. පසු කලෙක දෙවියකු පෙන්වූ මාර්ගයකින් චිත්තල්පව්ව විහාරයට වැඩ මෛත්‍රිය භාවනා වඩමින් හාර මසක් එහි වැඩ සිටි සේක. දිනක් අලුයම අවදිව පැලලුප් නුවරට යෑමට සිතා සක්මනෙහි යෙදෙන්නේ 'මණිලියා' නම් දේවතාවෙන් උන්වහන්සේ වෙත පැමිණියේය. "තොප කවරෙක්ද?" යි උන්වහන්සේ විමසූ විට "ස්වාමිනි, මම මණිලියා නම් දේවතාව වෙමි. ඔබ වහන්සේගේ මෙත් රැවය නිසා මේ ප්‍රදේශයේ අමනුෂ්‍යයන් ප්‍රීතියෙන් සුවපත් වී සිටිති. ඔබ වහන්සේ මෙහෙන් වුවහොත් නම් යළිත් වාද භේද අඬ දබර හට ගැනෙයි. එබැවින් මෙහිම වැඩ සිටිය මැනවැ" යි ආරාධනා කළේය. ඒ ආරාධනාව පිළිගෙන උන්වහන්සේ එහිම වැඩ සිටි සේක.

මෛත්‍රිය වඩන්නේ නම් කොපමණ අනුසස් ලැබේදැයි සිතනු මැනවි. ඉහත සඳහන් මෛත්‍රිය අප මහ බෝසතාණන් වහන්සේ පිරූ හැටි විශ්මයජනකය. චුල්ල ධර්මපාල ජාතක කල්හි රජ කුමරෙකුව ඉපිද සදරු වියෙහි සිටියදී පියරජු කෝපාවිෂ්ටව සදරු පුත් කුමරුගේ අත් පා කපා කඩ කඩ කපවයි අණ කරද්දී "ධම්මපාල, දැන් තොපට මෛත්‍රිය කිරීමට කාලයයි, තොප මරණයට පත් කළ පිය රජු කෙරෙහිද, තොපගේ මරණයට ශෝකවන මෑනී මොලොක් සිතක් ඇති මෑණියන් කෙරෙහිද, මරණයට හිමිවූ ඔබ කෙරෙහිද මෛත්‍රිය පතුරුවා තමන් තමන්ට අවවාද කොට මෙත් වැඩූ හැටි සිහිපත් කළ යුතුයි. මෛත්‍රිය භාවනාව වඩන භික්ෂූන් වෙසෙන ප්‍රදේශයෙහි වෙසෙන කොටි දෙනුන් හයින් ජීවිත මුව පැටවුන් තම දරුවන් යයි සිතා ප්‍රේම කොට කිරි පොවති. අව් රශ්මියෙන් වෙහෙසෙන සිරුරැති නාගයෝ තමන්ට සතුරු වූ මොණර පිල් සෙවණට වැද සැනසෙති. මෙත් වඩන්නන්ගේ ආශ්‍රයෙන් හමන සුළඟ වැදී මෙබඳු භාග්‍යම ලැබේ නම් අප සැමදෙනාම දිනපතා මෛත්‍රිය වැඩුවහොත් කෙබඳු අනුසස් ලැබේදැයි කල්පනා කර බලනු මැනවි. මෛත්‍රිය වඩන තැනැත්තා සුවසේ නිදයි. සුවසේ අවදි වෙයි. නපුරු සිහින නොදකියි. මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. දෙවියන්ගෙන් ආරක්ෂාව ලබයි. අහසේ බබළන ලස්සන චන්ද්‍රයා මෙන් මුහුණ පියකරු වෙයි. සිහි මුළා නොවී කළුරිය කරයි. මේ ආත්මයේදී රහත් නොවුණි නම් බ්‍රහ්ම ලෝකයෙහි උපදී. කරුණු මෙසේ බැවින් සියලු දෙනාම මෛත්‍රිය වැඩීමට උත්සාහ කළ යුතුය.

**පූජ්‍ය මැණික්හින්න රතනසාර හිමි**

# වන්දනා චාරිකාවන්හී යෙදීම









මෑතක සිට ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාව තුළ දඹදිව බෞද්ධ සිද්ධස්ථාන දක වැඳ පුද ගැනීමේ ආසාවක් සහ පෙළඹීමක් දක්නට ලැබේ. ගත වූ වසර කීපය තුළ දඹදිව වන්දනාවේ යෙදෙන බැතිමතුන්ගේ සංඛ්‍යාව ලක්ෂ ගණනින් වැඩිවී ඇති ආකාරයෙන්ද පෙනෙන්නට ඇත. ඒ වෙනුවෙන්ම රට පුරා බිහිවී ඇති චාරිකා සංවිධාන සහ පුද්ගලයන්ගේ පෙළඹවීමත්, දඹදිව සිද්ධස්ථාන පිළිබඳ ලියැවී ඇති පොත පත සහ ලිපි ලේඛන සුලභ වීමත්, සංචාරයෙහි යෙදෙන්නන් හරහා සම්ප්‍රේෂණ වන තොරතුරුත් මේ තත්ත්වයට හේතුවී ඇති බව පෙනී යයි. අප මේ ලිපිය ලියන්නට අදහස් කළේ දඹදිව වන්දනාවේ යාම පිළිබඳ විස්තර කිරීමට නොව, වර්තමානයේ උද්ගතව පවත්නා තත්ත්වයන් යටතේ දඹදිව වන්දනාවේ යාම පිළිබඳව දෙවරක් සිතන්නට ජනතාව පෙළඹවීම සඳහාය.

විවිධ ආගම් අදහන බැතිමතුන් තුළ තම ආගමික ශාස්තෘවරයාගේ නිජබිමට ගොස් වැඳ පුද ගැනීම උත්කෘෂ්ට පිංකමක් යන අදහසක් තිබේ. බෞද්ධයෝ දඹදිව යති. එසේ යාම ජීවිතයේ තම තමන් ලබන මහත් භාග්‍යයක් ලෙස සැලකීමට පුරුදු වී සිටිති.

බෞද්ධයන් දඹදිව වන්දනාවේ යාමට පෙළඹීමට හේතුවක් ලෙස පෙනෙන්නේ දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි එන බුද්ධ භාෂිතයකි.

බුදුරජාණන් වහන්සේ මල්ල රජදරුවන්ගේ 'උපවර්තන' නම් සල් උයනෙහි පිරිනිවන් මංචකයේ වැඩ සිටියදී ආනන්ද මහ තෙරුන් වහන්සේ උපවර්තනශාලාවේදී බුදු දහම, බුදු සසුන හා බෞද්ධ සමාජය පිළිබඳ විවිධ කරුණු කාරණා විමසූහ. ආනන්ද තෙරුන් වහන්සේගේ එක් පැනයක් වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් පසු සැදැහැවත් කුල පුත්‍රයෝ විසින් දක බලා සංවේගය ඉපදවිය යුතු තැන් මොනවාද? යන්නය. එහිදී බුදුරදුන්ගේ පිළිතුර වූයේ මෙසේය.

ආනන්දයෙනි, සැදැහැවත් කුල පුත්‍රයනට දක්නට සුදුසු සංවේග උපදවන ස්ථාන සතරක් වෙයි. එනම් තථාගතයන් වහන්සේ උපන් ස්ථානය, බුද්ධත්වයට පත්වූ ස්ථානය, ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූ ස්ථානය සහ පිරිනිවන් පා වදාළ ස්ථානය යන සතරය.

මෙහි සඳහන් වන කරුණු අනුව බුද්ධ චරිතය හා සම්බන්ධ එකී ස්ථාන සතර ශ්‍රද්ධාවන්ත බෞද්ධයකුට දකීමට සුදුසු වෙයි. ඊට හේතුව එකී ස්ථාන දකීමෙන් සංවේගය ඉපදීමයි. තමන් අදහන ධර්මයේ ශාස්තෘවරයාණන් වහන්සේ පවා ලෝක ස්වභාවයට අනුකූලව උත්පත්තිය ලබා ධර්මාවබෝධය කරගෙන, ඒ ධර්මය ලෝක සත්වයාට දේශනා කොට පිරිනිවන් පා වදාළේ යැයි සලකා අනිත්‍යානුස්මෘතියක් හටගැනීම, සංවේගය ඉපදීම යන්නෙන් අදහස් කෙරේ. එය බුද්ධාලම්බන ප්‍රීතිය නොව බුද්ධානුස්සති භාවනාවකි.

ශාසන ඉතිහාසයට අනුව එකී ස්ථාන දක වැඳ පුද ගන්නට ගිය ප්‍රථම ශ්‍රද්ධාවන්ත කුල පුත්‍රයා ධර්මාශෝක මහරජතුමාය. එතුමා එසේ ගියේ එම ස්ථාන වැඳ පුද ගැනීමට පමණක්ම නොව අනාගත පරම්පරාවට ප්‍රයෝජනවත් වන අන්දමින් ඒ ස්ථාන සංරක්ෂණය කර තැබීමටයි.

ලාංකිකයන් පමණක් නොව, ලෝකයේ වෙනත් රටවල විසූ සැදැහැවතුන්ද ඉමහත් භක්තියෙන් දඹදිව සිද්ධස්ථාන වැඳ පුද ගන්නට පැමිණි බවට ඓතිහාසික සාක්ෂි තිබේ. චීන ජාතික පාහියන්, හියුංසාන් වැනි දේශාටක භික්ෂූන් වහන්සේලාගේ චාරිකා සටහන් එහිලා වඩාත් වැදගත්ය.

වර්තමාන ලෝකයේ තාක්ෂණික දියුණුවත් සමඟ දඹදිව වන්දනාවේ හෝ සංචාරයේ යෙදෙන්නන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ ගියත, බෞද්ධ සැදැහැවතුන්ගේ අරමුණ දුර්ලභ පුණ්‍යකර්මයකට සහභාගී වීමට අවස්ථාව උදාකර ගැනීම වුවද, එය ජීවනෝපායක් බවට පත්කර ගත් ඇතැම් අයගේ අරමුණ ව්‍යාපාරික අතින් ලාභයක් උපයා ගැනීමය.

අද සිදුවී ඇත්තේ බැතිමතුන්ගේ ශ්‍රද්ධාව අලෙවි වීමය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ ජීවිත කාලයක් තිස්සේ ඉතිරි කරගත් මුදල් වැය කරමින් දඹදිව වන්දනාවේ යෙදෙන ඇතැම් දෙනෙකු මහත් දුෂ්කර තත්ත්වයට පත්වීමය. මාධ්‍ය හරහා ලැබෙන වාර්තා අනුව මේ වන විට ඉන්දියාවේ එක් ප්‍රාන්තයකට යාම අනතුරුදායක සංචාරයක් බවට පත්වෙමින් ඇති බවත්ද පෙනේ. අතරමංවීම, රෝගාතුරවීම, රැවටීම, වංචාවලට ගොදුරුවීම, නොසලකා හැරීම් ආදී දුක් දැන් ත්‍රස්තවාදී ප්‍රහාරයන්ද එකතු වී තිබීමෙන් ඒ බව තහවුරු වෙයි.

යහපත් කාර්යයකට මුල් තැන දී ඉන් සාධාරණව යමක් උපයා ගැනීම වෙනුවට ඇතැම් ව්‍යාපාරිකයන්ගේ ඒකායන අරමුණ කවර තත්ත්වයක් යටතේ වුවත් වැඩි පිරිසක් සංචාරයට සම්බන්ධ කර ගනිමින් තම ආර්ථික අරමුණ පමණක් මුදුන්පත් කරගැනීමය.

දඹදිව වන්දනාවේ යාම වරදක් නැත. කිසිදු බෞද්ධ භික්ෂුවක තබා සාමාන්‍ය බෞද්ධයකුවත් ඊට එරෙහි වන්නේද නැත. එහෙත් මේ සම්බන්ධයෙන් ගැඹුරින් සිතා බලා කටයුතු කිරීමට බෞද්ධයා නැඹුරු විය යුතු අවස්ථාවක් දැන් උදාවී තිබේ.

බුදුරජාණන් වහන්සේම අවධාරණය කර ඇති අන්දමට බුදුදහම ප්‍රඥාවන්තයන් උදෙසා නිර්දේශිත ධර්මයකි. (පඤ්ඤවන්තස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස) ඒ අනුව බෞද්ධයෝ ප්‍රඥාවන්තයෝ විය යුත්තාහ. මෙහිදී අප අදහස් කරන්නේ දඹදිව වන්දනාවේ යාම

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"

පිළිබඳව සෑම බෞද්ධයකුම ප්‍රඥාවෙන් සිතා බැලිය යුතු බවයි.

අප ජීවත් වන්නේ සම්මා සම්බුද්ධරාජාණන් වහන්සේගේ පාදස්පර්ශයෙන් තෙවරක්ම පාරිශුද්ධත්වයට පත්වූ දේශයක බව අප අමතක නොකළ යුතුය. ලෝකයේ නිර්මල ථෙරවාදී බුද්ධ ධර්මය තවමත් ආරක්ෂා වී ඇති රට අපේ ශ්‍රී ලංකාවයි. බුදු දහමේ නිජ භූමිය ඉන්දියාව වුවද, පිවිතුරු බුදු දහම පවතින්නේ අප මාතෘ භූමියේය. අද ඉන්දියාවෙහි යම්කිසි බෞද්ධ ප්‍රබෝධයක් ඇත්නම් එය ලැබුණේද ලංකාවෙන් එහි ගිය බෞද්ධ ධර්ම දූතයන්ගෙනි. ඒ අනුව, බුදුරදුන් උපන් බිමට වඩා සම්භාවනීයත්වයක් හිමිවන්නේ අපේ රටටය. එවන් සම්භාව්‍ය දේශයක උපන් අප අනේක දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙමින් වන්දනාමාන සඳහා දඹදිව යා යුතුමද?



සම්බුදු පා පහස ලත් සොළොස්මස්ථානය ඇතුළු දහස් ගණන් වෙහෙර විහාර අප රට පුරාම විසිරී තිබේ. එසේ සලකන විට අපේ රට පින් බිමක් වෙයි. ඒ වසර 2500ක අඛණ්ඩ ඉතිහාසයක් අපට තිබෙන බැවිනි.

මේ යථාර්ථය වටහා ගත් අපේ පැරැන්නෝ දේශීය වෙහෙර විහාරස්ථාන වන්දනාමාන කිරීම සඳහා වට වන්දනාවෙහි ගියහ. ගමේ කණ්ඩායම් වශයෙන් එක්ව 'තුන් සරණය' කියමින් මහත් ශ්‍රද්ධාවෙන් හා අස්වාදයෙන් එද ගිය ගමන් අද බොහෝ දෙනා දන්නේද නැත.


එද පැවැති වන්දනා ගමන් සම්ප්‍රදාය අනුව ගමේ අන්‍යොන්‍ය සහජීවනය තහවුරු වූ අතර දේශීය මුදල් සංසරණය වූයේද දේශය තුළමය. වන්දනාකරුවන්ගෙන් ලැබෙන පූජාධාරවලින් දේශීය බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය විය. අද අපි 'ලෝසෙට පරකාසේ ගෙදරට මිරගාතේ' යි කියන්නාක් මෙන් ගමේ දුප්පත් පන්සල් හරා වැටෙද්දී ජීවිතය පරදුවට තබා දඹදිව ගොස් එහි විහාර සංවර්ධන අරමුදලට දායක වන්නෙමු. ඇතැම් බෞද්ධ පින්වතුන්ට තමන්ගේ පාංශුකූලය සඳහා වැඩම කරන්නේ ගමේ පන්සලේ වෙසෙන දුප්පත් ස්වාමීන් වහන්සේලාය යන්න පවා අමතක වී ගොස් ඇති ආකාරයක් පෙනෙන්නට තිබේ. ඒ තරමට ගැති මානසිකත්වයක් අපේ සමහර බෞද්ධයන් තුළ මතුවෙමින් පවතී.

ඉන්දියාවේ අද ඇත්තේ මුල් බුදු සසුන නොවේ. අද දඹදිව බලා පියාසර කරන්නන්ට ඒ බව අමතක වී ඇත. අද තමිල්නාඩුවේ හිස ඔසොවා ඇති ඒ තත්ත්වය ඇතැම් විට නුදුරු අනාගතයේදී ව්‍යාප්ත වීමට ඉඩ ඇත. මේ වනවිටත් සිංහල බෞද්ධ පින්වතුන්ට විඳින්නට සිදුවී ඇති ගැහැට ඉදිරියේදී තවත් උත්සන්න වීම වැළැක්විය නොහේ. වන්දනාවේ යාම බෞද්ධ දර්ශනයට අනුකූල නොවෙතත් කිසියම් බෞද්ධයකුට එසේ යාමට බුදු දහමෙන් බාධාවක්ද නැත. වන්දනා ගමනකින් ලබන තාවකාලික බුද්ධාලම්බන ප්‍රීතිය හෝ රත්නත්‍රය පිළිබඳ ශ්‍රද්ධාව ධර්මානුකූලව පිනක්ද වෙයි. 'චිත්තං පුනාති හි පුඤ්ඤං' (සිත යනු සිතෙහි උපදින ධාර්මික සතුටයි) යන අර්ථ නිරූපණය අනුව ඒ බව පැහැදිලිය.

බුද්ධ දේශනය අනුව බෞද්ධයා හැමවිටකම කළ යුත්තේ තමන්ටත්, අනුන්ටත් ප්‍රයෝජනවත් දේය. 'බහුජන හිතාය, බහුජන සුඛාය, අත්ථාය හිතාය' යන බුදු වදනින් ඒ බව තහවුරු වෙයි. කිසියම් ක්‍රියාවක් තමන්ටත්, අනුන්ටත් අහිත පිණිස වේද ඉන් වැළකීම, එය නොකර සිටීම වඩාත් වැදගත්ය. හිතකරය. දඹදිව වන්දනාවේ යාමෙන් එසේ යන පුද්ගලයා ලබන ප්‍රතිලාභවලට වඩා වැඩි ප්‍රතිලාභයක් ලබන්නේ ඉන්දියාවය. ඒ ගමන් සංවිධානය කරන්නවුන්ය. මේ රටේ සහ ඒ රටේ එකී ව්‍යාපාරයට සජීව හා වක්‍රව සම්බන්ධව සිටින්නන්ය. එහෙත් ඒ ගමනේදී මුහුණ පාන්නට වන සියලු අහිතකර තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදුවන්නේ ගමනෙහි යෙදෙන්නාට පමණි. එබඳු අවස්ථාවන්හී අන් සියලු දෙනා වගකීමෙන් මිදෙති. මේ පිළිබඳ මනා තරම් උදාහරණ ඉදිරිපත් කරන්නට පිළිවන.


මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තක් නම්, අනාථ සද්භාවයෙන් හා මානව දයාවෙන් යුතුව දඹදිව වන්දනා ගමන් සංවිධානය කරන අභලොකස්සද සිටින බවය. එබඳු සංවිධායකවරයකුට වුවත් තම තාවයේ සාමාජිකයකු විපතකට පත්වූ විට ශෝක කරනු හැර වෙනත් කළ හැක්කක් නොමැත.

මේ සියලු කරුණු කාරණා සැලකිල්ලට ගත් විට වර්තමාන තත්ත්වය යටතේ අපට ගත හැකි එකම විකල්පය නම් අපේ සාම්ප්‍රදායික වට වන්දනා සංස්කෘතියට යළි අනුගත වීම නුවණට හුරු බවය. එය තම තමන්ගේ ශරීර සෞඛ්‍යයටත් රටේ ආර්ථිකයටත්, ශ්‍රී ලංකා බුද්ධ ශාසනයේ චිර පැවැත්මටත් එකසේ යහපත්ය.



**පූජ්‍ය අලුත්වැව සෝරත හිමි**





"සත්පුරුෂයන්ගේ උපදෙස් අනුව වැඩ කරන්නෝ දියුණුවට පත්වෙති - චුල්ලසෙට්ඨි ජාතකය"

# තමන්ටම වද දෙන
# පාපී සිත

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්ෂු සංඝයා සමග කොසොල් රට චාරිකාවෙහි හැසිරෙන සේක. දිගු මගට පිළිපන් භාග්‍යවතුන් වහන්සේ එක්තරා ප්‍රදේශයක මිනිසුන් මර මරා විකුණන මිනිසුන් මරන්නෙකු දුටු සේක. දැක මඟින් ඉවත්ව එක්තරා රුක් මුලක පැනවූ අසුනෙහි වැඩ හිඳි සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක.

"මහණෙනි, අර මිනිසුන් මර මරා විකුණන මිනිසුන් මරන්නා ඔබ දුටුවාද?"

"එසේය ස්වාමිනි."


"මහණෙනි, ඔබ කුමක් සිතන්නහුද, මිනිසුන් මර මරා විකුණන මිනිසුන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ ඔබ දැක තිබේද, අසා තිබේද?"

"එසේ නැත, ස්වාමිනි. අසා නැත."

"හොඳයි මහණෙනි, මිනිසුන් මර මරා විකුණන මිනිසුන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථවාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ මා විසිනුත් දැක නැත. අසා නැත."

"එයට හේතු කවරේද?"

"මහණෙනි, හෙතෙම පාපී සිතෙන් මිනිසාට වධ දෙයි, මරයි. එහෙයින් හෙතෙම ඇත් වාහනයෙන් යනු හෝ අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ නොවෙයි."



"මහණෙනි, ඔබ කුමක් සිතන්නහුද, ගවයන් මර මරා විකුණන ගවයන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ ඔබ දැක තිබේද? අසා තිබේද?"

"එසේ නැත, ස්වාමිනි, අසා නැත."

"හොඳයි මහණෙනි, ගවයන් මර මරා විකුණන ගවයන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ මා විසිනුත් දැක නැත, අසා නැත."

"එයට හේතු කවරේද?"

"මහණෙනි, හෙතෙම පාපී සිතෙන් ගවයනට වධ දෙයි, මරයි. එහෙයින් හෙතෙම ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ නොවෙයි."

"මහණෙනි, ඔබ කුමක් සිතන්නහුද, බැටළුවන් මර මරා විකුණන බැටළුවන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිවන වසනු හෝ ඔබ දැක තිබේද, අසා තිබේද?"

"එසේ නැත ස්වාමිනි, අසා නැත."

"හොඳයි මහණෙනි, බැටළුවන් මර මරා විකුණන බැටළුවන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ මා විසිනුත් දැක නැත, අසා නැත."

"එයට හේතු කවරේද?"

"මහණෙනි, හෙතෙම පාපී සිතෙන් බැටළුවනට වධ දෙයි, මරයි. එහෙයින් හෙතෙම ඇත් වාහනයෙනු යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ නොවෙයි."

"මහණෙනි, ඔබ කුමක් සිතන්නහුද, ඌරන් මර මරා විකුණන ඌරන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ ඔබ දැක තිබේද, අසා තිබේද?"

"එසේ නැත ස්වාමිනි, අසා නැත."

"හොඳයි මහණෙනි, ඌරන් මර මරා විකුණන ඌරන් මරන්නෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ මා විසිනුත් දැක නැත, අසා නැත."

"එයට හේතු කවරේද?"

"මහණෙනි, හෙතෙම පාපී සිතෙන් ඌරනට වධ දෙයි, මරයි, එහෙයින් හෙතෙම ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ නොවෙයි."

"මහණෙනි, ඔබ කුමක් සිතන්නහුද, මුවන් මර මරා විකුණන මුව වැද්දෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ, මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ ඔබ දැක තිබේද, අසා තිබේද?"

"එසේ නැත ස්වාමිනි, අසා නැත."

"හොඳයි මහණෙනි, මුවන් මර මරා විකුණන මුව වැද්දෙක් ඒ කර්මයෙන්, ඒ ජීවත් වීමෙන් ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ මා විසිනුත් දැක නැත, අසා නැත."


"එයට හේතු කවරේද?"

"මහණෙනි, හෙතෙම පාපී සිතෙන් මුවන්ට වධ දෙයි, මරයි, එහෙයින් හෙතෙම ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ නොවෙයි."

"මහණෙනි, හෙතෙම පාපී සිතෙන් තිරිසන් ප්‍රාණීන්ට වධ දෙයි, මරයි. එහෙයින් හෙතෙම ඇත් වාහනයෙන් යනු හෝ, අශ්ව වාහනයෙන් යනු හෝ, රථ වාහනයෙන් යනු හෝ, යාන වාහනයෙන් යනු හෝ, භෝග අනුභව කරනු හෝ මහත් වූ භෝග සම්පත් ඇතිව වසනු හෝ නොවෙයි. යම් හෙයකින් මිනිසා වූවකුට පාපී සිතෙන් වධ දෙයි, මරයි යන්න පිළිබඳව කියනුම කවරේද? මහණෙනි, එය ඔහුට බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස වෙයි. කය බිඳී මරණින් මතු අපාය නම් වූ, දුගති වූ, දුක් සහිත වූ නිරයෙහි උපදියි."

**රෝහිත විජේතිලක**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ අදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."



# කරුණා ශාන්තිය උපදවන
# ක්ෂාන්තිවාදී ජාතකය

ක්ෂාන්තිවාදී ජාතකයේ දී අප මහ බෝසතාණන් වහන්සේ, බමුණු කුලයක ඉපිද කුණ්ඩක කුමාරයෝය' යි ප්‍රසිද්ධ වූහ. දෙමව්පියන් අවෑමෙන් ඔවුන්ගේ සම්පත් හිමිව, ඒ සම්පත් දන විෂයෙහි විසුරුවා පඤ්චකාමයෙහි ආදීනව දැක, පැවිදිව හිමාලය වනයට ගොස් එහි තපස් රක්නාහ. දිනක් ලුණු ඇඹුල් සපයනු පිණිස , බරණැස් නුවරට එන්නේ රජ්ජුරුවන්ගේ මඟුල් උයනට වැද එහි සිට භික්ෂාව පිණිස වීථියෙහි හිඟා ඇවිදිනාහු. සෙනෙවිරදුන්ගේ නිවසටද පැමිණියහ.

සෙනෙවිරදුන් මුන් වහන්සේ කෙරෙහි පැහැද, එවක් පටන් තමන්ගේ ගෙයින්ම දන් දී උපස්ථාන කරන්නේය.

එසමයෙහි එක් දවසක් කලාබු රජ්ජුරුවෝ රා බී මත්ව සත් දවසක් බිසෝවරුන් පිරිවරා , උයන් කෙළියට යන්නේ, එහි ගොස් මඟුල් සලවට මස්තකයෙහි කරුණාවෙන් යුත් එක් ස්ත්‍රියකගේ සමීපයෙහි කලවයෙහි හිසතබාලා වැදහොත්තාහ.

සොළොස් දහසක් වූ නාටක ස්ත්‍රීහු අපගේ රජ්ජුරුවන් නිදන කල, අප නානා දක්වන්නේ කාටද' යි කියා, නාටක නාවකා ගොස් තාපසයන්ගේ ගස්මුල වටලාගෙන බණ අස අසා උන්නාහ. එකියන ස්ත්‍රිය තමා කලවය සොලවා රජ්ජුරුවන් පිබිදුවිය. පිබිද මඟුල් සල්වට මත්තෙහි නිදනේ ඒ ස්ත්‍රියගෙන් අසන්නේ,

"මෙතැන සිටියාවූ ස්ත්‍රීන් කොහි ගියේ ද" යි විචාළේය. එවිට ඒ ස්ත්‍රිය කියන්නේ,

'උන් තාපස කෙනෙක් ළඟ හිඳ බණ අසති' යි කීවාය. තාපසයන් කෙරෙහි වෛරයෙන් කුට තාපසයන් මරමි' යි කියමින් නැඟී සිට කඩුව අයාගෙන දිවූහ.

රජ්ජුරුවන්ගේ වල්ලභ ස්ත්‍රීහු ඒ දැක රජ්ජුරුවන් ඉදිරියට දිවවිත් කඩුව පැහැර ගත්හ.

ඉන්පසු රජ්ජුරුවෝ තාපසයන් සමීපයට ගොස් අසන්නේ "තොපි කුමනවාදී ද' යි විචාළහ.

එවිට අප මහ බෝසතාණන් වහන්සේ "මහරජ් මම ක්ෂාන්තිවාදී වෙමි' යි කීහ.

රජ්ජුරුවෝ 'ක්ෂාන්තිවාදීය' යි කියන්නේ කුමක්ද' යි විමසූ විට බෝසතාණන් පවසන්නේ

"මා කෙරෙහි මෛත්‍රී කරන්නහු කෙරෙහිත් මෛත්‍රී නොකරන්නහු කෙරෙහිත් මම එකම කරුණාව පතුරුවමි'යි පැවසූ හෙයින් රජ්ජුරුවෝ 'මුන්ගේ ක්ෂාන්තිය බලන්ට වුව මැනව' යි සිතා වධකයා ගෙන්වූහ.

වධකයා රත් කඩක් හැඳ රත් කඩක් කරලා, රත්මල් පැළඳ පොරවක් අතින් ගෙන පැමිණියේ "රජතුමනි! කවරක්හට කවර වධයක් කෙරෙම් ද' යි ඇසීය.

"අහිස් නාට වධ කරන්වද? මේ කුට තාපසයා ඉස, බිමලා එළාගෙන , පිටපාර පන්සියක්ද , ඔඩපාර පන්සියයක්ද , දැළලහි දෙසිය දෙසියක් ද ගසාලව' යි කීහ.

එවිට වධකයා කී පරිද්දෙන්ම අප මහ බෝසතුන්ට ගෙඩිගසා ලූහ.

එවිට රජ්ජුරුවෝ බෝසතුන්ගෙන් අසන්නේ

'තවමත් තොපගේ ක්ෂාන්තිවාදය නොගියේ ද' යි විචාළේය. එවිට බෝසතාණන් පිළිතුරු දෙන්නේ,

'ඇයි මහරජ් මාගේ ක්ෂාන්තිය පයෙහි යැ' යි කීහ.

රජ්ජුරුවෝ 'පයක් කපා හරුව' යි කී හෙයින් , වධකයාත් කී ලෙසම කෙළේය. මේ ආකාරයෙන් අත් පා කන් නාසා කැපූයේ බෝසතාණෝ ඉන් වැගෙන ලෙයෙහිම රැඳී සිත්තාහ. එසේ සිට බෝසතාණෝ කියන්නාහු.

"මහ රජ ක්ෂාන්ති නම් අත් - පා - කන් - නාසා යෙහි සිටු දෙයක්ද?" යි කීහ. එවිටත් තෝ කුමන වාදී ද' යි විචාළෙන් බෝසතාණන් කියන්නේ,

"ඇයි මහරජ මාගේ අත් පා කැපුව' යි කියා මාගේ ක්ෂාන්තිය ඇත්තේ මාගේ හෘදයෙහි වේද? තොප කුමක් කළත් මාගේ ක්ෂාන්තියට කුමක් වේද' යි ඇසූහ.



එවිට රජ්ජුරුවෝ 'තොපගේ ක්ෂාන්තිය තොපගේ ලෙහිමද' යි අසමින් ළයට පයින් ඇන ගියේය.

ඒ වේලාවට තාපසයන්ට උපස්ථාන කරන්නාවූ සෙනෙවිරද තාපසයන් කරා පැමිණියේ තාපසයන්ගේ කැපූ අත් පා කන නාසා අවුලාගෙන කඩක බැඳ ඇග ලේ පිසදමා තාපසයන් එක් තැනෙක සකප්පට වැඳ එකත්පස්ව හිඳ කියන්නේ

'උත්තමයන් වහන්ස! වධ කෙළේත් රජ්ජුරුවන්ය. කෝප නොකරනත් , රජ්ජුරුවන්ට ම කළ මැනව' යි කීහ. එවිට බෝසතාණන් වහන්සේ කියන්නේ

'කසී රට කලාබු රජ්ජුරුවන් විසින් මාගේ අත් පා කන් නාසා කප්පවා වධ පමුණුවන ලද්දේය. එසේ වුවත් මම රජ්ජුරුවන්ට වෛර නොකරමි. රජ්ජුරුවෝ චිරාත් කාලයක් ජීවත් වේවා! සුවපත් වේවා' යි කියා මෛත්‍රී කළහ.

ඒ බෝසතාණන්ට වධ පැමිණ වූ , කසී රට කලාබු රජ්ජුරුවෝ බෝසතාණන්ගේ දෘෂ්ටි මාතයෙන් නොඉක්මෙන තරමේ උයන් කෙළවරට යන්නේ , මහ පොළොව පැලී අවීචිමහ නරකයෙන් ගිනි කඳක් අවුත් රජ්ජුරුවන් වෙලාගෙන අවීචිමහා නරකයට ඇදගෙන ගියේය. පෙර රත්නාලියේ ඉපවරය, මෙද මහබෝ ඒ බෝසතාණන්ට වධ පැමිණ වූ කලාබු රජ්ජුරුවෝ නම් දැන් මේ දේවදත්තයන්මය.

"නිතර අනුන්ගේ දොස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී ආශ්‍රව ධර්ම වැඩෙත්, ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

බොදු පුවත්

# ශ්‍රී දළදා සමිඳු තේවාමුරය අස්ගිරිය මහා විහාරයට



**මහනුවර** ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රී දළදා සමිඳු තේවාව මල්වතු මහා විහාරයෙන් අස්ගිරිය මහා විහාරයට ඇසළ පොහොය දිනයෙන් පැවරීමේ චාරිත්‍රය මල්වතු මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවනීය මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමිපාණන් වහන්සේලාගේ සහ ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතාගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණ.

පසන සඳහන් අස්ගිරිය මහා විහාරයේ මහාසංඝරත්නය ලබන වසරේ 2015 ඇසළ පොහොය තෙක් ශ්‍රී දළදා සමිඳු තේවාව මාරුව ශ්‍රී දළදා මාලිගාවේ වස් එළඹ වැඩ සිටිති. මේ අනුව අස්ගිරිය ගෙඩිගේ රජ මහා විහාරවාසී පොළොන්නරුව පොහොළාන් මජ්ධානායිපති ශාස්ත්‍රපති වේඩරුවේ උපාලි, අස්ගිරිය මහා විහාර කාරක සංඝ සභාවේ කාරක සභික නියෝජ්‍ය ලේඛකාධිකාරී අස්ගිරිය මහා විහාර පරිවේණාධිපති ශාස්ත්‍රපති නාරන්පනාවේ ආනන්ද, අස්ගිරිය කාරක සංඝ සභාවේ කාරක සභික අරම්පිටගම සරණංකර, අස්ගිරිය මහා විහාර පිරිවෙන් නියෝජ්‍ය පරිවේණාධිපති, තාරලේවාලවිහාරවාසී ඇටිපොළ මහින්ද, යටිනුවර ගම ඉසිපතනාරාමාධිපති කොටුගම සීලරතන හිමිවරු තේවාව සිදුකරති.

වස් ආරාධනාව ශ්‍රී දළදා මාලිගාවේ කැපිත පිංකම සිදුකරන කොත්මලේ පුදුරම පිල් මැණියන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි.

# භාරකාර පදවිය ලබති

**අලුව්ව** ඓතිහාසික හුම්බුළුව රජමහා විහාරාධිපති ගලගම ශ්‍රී ධම්මසිද්ධි ධම්මානන්ද අත්ථ දස්සාභිධාන අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අනුනායක මාහිමිපාණන් වහන්සේගේ ඉල්ලීම පරිදි විහාරාධිකාරී පූජ්‍ය පාද ගරු උරුලෑවත්තේ ධම්මකිත්ති හිමිපාණන් වහන්සේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමා විසින් ඓතිහාසික හුම්බුළුව රාජමහා විහාරයේ භාරකාර ධුරය සඳහා පත්කරනු ලැබ ඇත.

මූලික අධ්‍යාපනය යටවත්ත වීර පරාක්‍රම මහා විද්‍යාලයෙන් ලබා උසස් අධ්‍යාපනයට පිවිස 1993 වර්ෂයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු උන් වහන්සේ එම කාලතුළදී සමුගෙන ශ්‍යාමෝපාලිවංශික අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අනුනායක ඓතිහාසික මහියංගණ රාජමහා විහාරාධිපති මහෝපාධ්‍යාය අග්ග මහා පණ්ඩිත කෝඩිපිලියාදී ගුණ ගුණාංග සංයුත ස්ථවිර ලංකාර රාජකීය පණ්ඩිත ත්‍රිපිටකවේදී අතිපූජ්‍යපාද ගරු ගලගම ශ්‍රී ධම්මසිද්ධි ධම්මානන්ද අත්ථදස්සාභිධාන මා හිමිපාණන් වහන්සේ සහ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සභික ඓතිහාසික මහියංගණ රජ මහා විහාර භාරකාර ලෝක බෞද්ධ සම්මේලනයේ විධායක සභික ශාස්ත්‍රවේදී පණ්ඩිත පූජ්‍යපාද ගරු උරුලෑවත්තේ ධම්මරක්ඛිතාභිධාන නාහිමිපාණන් වහන්සේ යන දෙනම ගුරු කොට ගෙන වර්ෂ 2000 පෙබරවාරි මස 17 වෙනි දින ප්‍රව්‍රජිත භූමියට පත්විය.

2001 වර්ෂයේ මැයි මස 27 වෙනි දින අධිශීල සංඝයාහ උපසම්පදා සීලය ලැබූ උන් වහන්සේ ඉතා කෙටි කලකින්ම ගුවන් විදුලි හා රූපවාහිනී සේවාවන්හි චතුර පරිත්‍රාණ භාණකත්වයට පත්ව විශාල ප්‍රසිද්ධියකට ද පත් වූහ.

ශ්‍යාමෝපාලිවංශික අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක ධුරන්ධර රාම්පිටි ලාලීල රජමහා විහාරාධිපති අග්ග මහා පණ්ඩිත මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත අති පූජ්‍ය පාද ගරු උඩුගම ශ්‍රී ධම්මදස්සි රතනපාල බුද්ධරක්ඛිතාභිධාන මහානාහිමිපාණන් වහන්සේ විසින් අස්ගිරි මහා විහාරීය කර්මාචාර්ය පදවියට 2005 වර්ෂයේ මැයි මාසයේ දී පත් කොට වදාළහ.


2012-2013 වර්ෂවල මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ තේවා කටයුතු සඳහා පත්වූ උන් වහන්සේ 2013 වර්ෂයේ ජනවාරි මාසයේ දී මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාරවරයෙකු ලෙස අධිකරණ අමාත්‍යාංශයෙන් පත් කොට වදාළහ. අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍යපාද අනුනායක මාහිමිපාණන් වහන්සේ විසින් 2010 වර්ෂයේ දී විහාරාධිකාරී තනතුරට පත්කර ලදී. 2002 වර්ෂයේ සිට ඓතිහාසික හුම්බුළුව රජ මහා විහාරයේ ආගමික සාමාජික කටයුතු වල නිරත වෙමින් අනගි මෙහෙවරක් ඉටු කරති.

ශ්‍රමණ ස්වරූපයට ගැලපෙන පරිදි ජීවිතයක් ගෙන යන ධම්මකිත්ති හිමිපාණන් වහන්සේ මහා සංඝරත්නයේ හා ජනී ජනයාගේ ප්‍රසාදයට පත්ව ඇති හිමි නමකි.

ඓතිහාසික හුම්බුළුව රාජ මහා විහාරය වූ කලී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් විසින් අස්ගිරි මහා විහාරයේ ප්‍රථම මහානායක උරුලෑවත්තේ ධම්ම සිද්ධි මහානායක මාහිමිපාණන් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උරුලෑවත්තේ සලවෙති අත්ථදස්සි හිමිපාණන් වහන්සේට තල්පිය සන්නස සමඟ දක්ෂිණෝදක කොට අක්කර 832ක් සන්නසකින් පූජා කරන ලදී. එසේම තේවාවන් සඳහා ඉඩකඩම් ද පූජා කළේය. ප්‍රථම මහානායක මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරේ 09 වෙනි විහාරාධිපති අස්ගිරි මහා විහාරයේ වර්තමාන අනුනායක මාහිමිපාණන් වහන්සේය.

ඓතිහාසික හුම්බුළුව රාජ මහා විහාරයේ රාජ රාජ මහා මාත්‍යාදීන්ගේ සමයේ සිට පැවැතගෙන ආ නාමිදු ගෙමි විහාරයේ භාරකාර ධුරයට ප්‍රථම වරට පත්වීමේ ගෞරවය හිමිවනු ලබන්නේ ද ගරු උරුලෑවත්තේ ධම්මකිත්ති හිමිපාණන් වහන්සේටය.

2014 ක් වූ ජූනි මස 26 වෙනි දින ඓතිහාසික හුම්බුළුව රාජ මහා විහාරයේ භාරකාර ධුරයට පත් වූ පූජ්‍ය පාද ගරු උරුලෑවත්තේ ධම්මකිත්ති හිමිපාණන්ට දීර්ඝායු ලැබ චිරාත් කාලයක් ශාසනික ආගමික කටයුතු සිදු කරන්නට ශක්තිය ධෛර්යය තෙරුවන්ගේ සරණින් ලැබේවා යි ආශිංසනය කරමු.




# සිත නිවන වෛර වෛරී උදන පැවිදි උත්සවයේ ධර්මදානයට පිරිනැමේ

**මහනුවර** මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම මහෝපාධ්‍යාය අග්ග මහා පණ්ඩිත අලුත්ගම ධම්මානන්ද නාහිමි දෙනම උපාධ්‍යායත්වයෙන් කුල දරුවන් දෙදෙනෙක් ගන්නෝරුව රජ මහ විහාරාධිපති යටිනුවර උප ප්‍රධාන අධිකරණ සංඝනායක අම්බන්පොල සුමංගල, ඒ අනුවහ පුරාණ විහාරාධිපති රාජකීය පණ්ඩිත මාතලේ අරියධම්ම යන හිමිවරුන්ගේ ආචාර්යත්වයෙන් සසුන් ගත කිරීමේ උත්සවයේ දී ධර්මදානයක් ලෙස ශ්‍රී දළදා මාලිගාවේ බෞද්ධ තොරතුරු අංශයේ ධර්මාධ්‍යක්ෂ කේ. මීගහකුඹුරේ මහතා විසින් රචිත සිත නිවන වෛර වෛරී උදන නමැති ධර්ම ග්‍රන්ථය මහා සංඝරත්නය වෙත ප්‍රදානය කිරීමක් සිදුවිය. මෙදින සසුන්ගත වූ අලෝක අහංවල (චමේ), ධම්මික (අනුෂ්) යන කුල දරුවන් ගන්නෝරුවේ සුමනරතන, උඩගල දෙමව්පියන්ගේ සෝමරතන යන පැවිදි නම්වලින් සසුන් ගත වූ අවස්ථාව ධර්මදාන ප්‍රදානයේ දී අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට උදාර සේවයක් ඉටු කළ මීගහකුඹුරේ වැනි අධ්‍යාපන ග්‍රන්ථ විශාරදයෙකු අතින් සිත නිවන වෛර වෛරී උදන වැනි විචාරාත්මක බෞද්ධ ග්‍රන්ථයක් සංස්කරණය වීම එතුමාගේ විචාරක අංශයේ උසස් සේවාවක් ලෙස සිහිය නැති බව අස්ගිරි මහා විහාරයේ මහෝපාධ්‍යාය හාරිස්පත්තුව ප්‍රධාන සංඝනායක මිවිටවි ප්‍රඥා තිස්ස නාහිමි සඳහන් කරනු ලැබීය.

කේ. බණ්ඩාරනායක

## මෙම පුදබිම කුමක්දැයි නම්කර වටිනා ත්‍යාගයක් හිමිකර ගන්න

මෙහි පහත දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පිහිටි වටිනා පුද බිමක පැරණි ඡායාරූපයකි. එය කුමක්දැයි නම් කොට පිළිතුර තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවන්න. එහි ඔබේ නම හා ලිපිනයද සඳහන් කරන්න. ඔබේ පිළිතුර එවිය යුත්තේ, සංස්කාරක, දළදා වරුණ, දළදා මාලිගය, මාධ්‍ය ඒකකය, මහනුවර යන ලිපිනයටයි.



**(නිවැරදි පිළිතුර එවනු ලබන ජයග්‍රාහී වාසනාවන්තයාට දර්ශනීය ශ්‍රී දළදා පෙරහර සහිත රාමු කරන ලද වටිනා තිළිණයක් පරිත්‍යාග කෙරේ. මෙම වටිනා ත්‍යාගය පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන්නේ ප්‍රකට විද්‍යා ලේඛකයකු වන අනුර සී. පෙරේරා මහතා විසිනි. එතුමාගේ ආදරණීය මෑණියන් වන චාලට් මොහොට්ටි මහත්මියට හා ලෝ වැසි සියලු දෙනාටම සෙත්පතා මෙම ත්‍යාගය පිරිනැමේ.)**

පසුගිය සතියේ 'පුදබිම' නිවැරදිව හඳුනාගත් ජයග්‍රහණය ලැබූ වාසනාවන්තයා

**ආර්. බී. විජේකෝන්**
අංක : 26, මොලගොඩ,
හරංකහව.

(ඔබේ ත්‍යාගය ලබා ගැනීම සඳහා හැඳුනුම්පත සමග ශ්‍රී දළදා මාළිගාවේ මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාලය වෙත පැමිණෙන්න)

පසුගිය කලාපයේ (අප්‍රේල්) ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර:
**ඉසුරුමුණිය**

බොදු පුවත්

## කර්මාචාර්ය පදවිය ලබති



**මහනුවර** අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ මහානායක උඩුගම ශ්‍රී බුද්ධ රක්ඛිත මහා නිමිපාණන් විසින් අස්ගිරිය මහා විහාරවාසී හරංකහව, ගේතේගම ශ්‍රී සංඝානන්ද නියෝජ්‍ය පරිවේණාධිපති ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත මැණික්හින්නේ රතනසාර හිමි අස්ගිරිය මහා විහාරයේ කර්මාචාර්ය පදවියට පත්කර ඇත. ශ්‍රී දළදා මාලිගාවේ ශ්‍රී දළද සමිඳු උදෙසා පෙවා කටයුතුවල වර්ෂ 2001 සහ 2008වල නිරතව සිටි රතන සාර හිමි "බෝධි පූජා සහ සෙත්පිරිත්" මැයින් පොතක් සංස්කරණය කර ධර්මදානයක් ලෙස ද බෙද දී ඇත. පේරාදෙණිය ශ්‍රී භාරතී පිරිවෙන් නියෝජ්‍යපති ලෙස සේවය කර ඇති රතනසාර හිමි ශ්‍රී දළද මාලිගාවේ තේවාවෙහි නිරතව සිටියදී දළද සමිඳු තේවා පූජාවන් සඳහා පරිහරණය කරන ගේම කළ සහ බුද්ධ පූජා පාත්‍ර රිදියෙන් කැටයම් කර ශ්‍රී දළදා සමිඳුන්ට පූජා කර තිබේ. මධ්‍යම පළාත් පාලි භාෂා සංසදයේ ලේකම් වශයෙන් ද සේවය කරයි.

## වත්තේගම ධම්මාවාස නාහිමිපාණන්ට චිරං ජයතු !

**පේරාදෙණිය** ශ්‍රී පුෂ්පාරාම ශ්‍රී සැණංලංකාර ජාත්‍යන්තර භික්ෂු අභ්‍යාස ආයතනයීය මහා පිරිවෙනා සර විහාරාධිපති ඕස්ට්‍රේලියානු මහාදිවයිනේ හා උඩරට අමරපුර මහා නිකායේ මධ්‍යම පළාත් ප්‍රධාන සංඝනායක හා ශාසන ජෝතිකා කාරක සංඝ සභාවේ සම ලේඛකාධිකාරී, ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර ශ්‍රී ලංකාරාම මහා විහාරාධිපති සිරි සුගත සද්ධර්ම ශාසන ගෞරව විශ්ව කීර්ති ශ්‍රී ධම්ම විශාරද පණ්ඩිත පූජ්‍යපාද වත්තේගම ධම්මාවාස නාහිමිපාණන්ගේ ජූලි නව වෙනි දිනට යෙදී තිබුණු පනස් හත්වැනි ජන්මෝත්සවය නිමිත්තෙන් ආගමික කටයුතුවලට මුල්තැනක් දෙමින් සමාජ සත්කාර වැඩසටහන් මාලාවක් ශ්‍රී සැණංලංකාර ජාත්‍යන්තර භික්ෂු අභ්‍යාස ආයතනය ශ්‍රී පුෂ්පාරාමය මූලස්ථානය කරගෙන සංවිධාන කර තිබුණි.

දේශීය හා විදේශීය ජාත්‍යන්තර මට්ටමෙන් පසුගිය දශක හතර තුළ ශාසනික ආගමික බෞද්ධ සංස්කෘතික බෞද්ධ අධ්‍යාපනික හා ගම් නියම් ගම් සංවර්ධන ව්‍යාපෘති මගින් සම්බුද්ධ ශාසනයටත් බෞද්ධ ගම්මානයන්හි අධ්‍යාපනික හා සාමාජීය දියුණුව උදෙසා සේවාවන් රැසක් ඉටුකර ඇති වත්තේගම ධම්මාවාස නාහිමියෝ සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමි වූ ගම්මාන නිවාස සංවර්ධන යෝජනා ක්‍රමයන් ආරම්භ කිරීම දෙමව්පියන් අහිමි වූ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම භික්ෂු නායකත්ව පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සැණංලංකාර ජාත්‍යන්තර භික්ෂු අභ්‍යාස ආයතනය හා ජාත්‍යන්තර බෞද්ධ පුස්තකාලයක් ස්ථාපිත කිරීම වැනි සමාජ ආගමික සත්කාර සේවාවන් රැසක් ක්‍රියාත්මක කර ඇත. පුෂ්පාරාමය ධර්ම ප්‍රචාරක මූලස්ථානය කරගෙන මුළු වසර තුළම විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ධම්මාවාස නාහිමියෝ සම්බුද්ධ ශාසනය වෙනුවෙන් උදාර මෙහෙවරක් ඉටුකරති. වත්තේගම ධම්මාවාස නාහිමිට චිරං ජයතු!

**කේ. බණ්ඩාරනායක**

## උඩරට අමරපුර නිකායේ පනස් නමක් උපසම්පදාව ලබති

**උඩරට** අමරපුර නිකායේ අනිපුර්ව මහානායක අග්ග මහා පණ්ඩිත තෙරිපැහැ සෝමානන්ද නාහිමිපාණන්ගේ සහ උඩරට අමරපුර නිකායේ අනුනායක සාහිත්‍යාචාර්ය රාජකීය පණ්ඩිත අත්තරගම වජිරජෝති නාහිමිපාණන්ගේ උපාධ්‍යායත්වයෙන් සාමණේර ස්වාමීන් වහන්සේලා පනස් නමක් මෙවර නුවරඑළියේ සහ පේරාදෙණිය ගන්නෝරුව පිරිමාලෙහි සීමා මාලකයේදී උපසම්පද ශීලයෙහි පිහිටුවනු ලැබීය.

උඩරට අමරපුර නිකායේ ශාසන ජෝතිකා කාරක මහා සංඝ සභාවේ සමලේඛකාධිකාරී ශාස්ත්‍රපති පරිත්තුවර සුමිත පණ්ඩිත වත්තේගම ධම්මාවාස හිමිවරු ඇතුළු සංඝ සභාවේ කාරක සභික හිමිවරු දින දෙකක් තිස්සේ පවත්වන ලද මෙම විනය කර්ම කටයුතුවලට සහභාගි වූහ.


සිරිමත බෝ පදනම සහ සිරි සිදුහත් භික්ෂු පදනම මෙම පූජා කටයුතුවලට සහභාගි වූ මහා සංඝයා වහන්සේලා සහ ගිහි පිරිස වෙනුවෙන් සංග්‍රහ කටයුතු සිදුකළ බව කාරක සභික බටුගොඩ සංඝිව හිමි සඳහන් කරති.

# සදහම් ප්‍රහේලිකා අංක - 78

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා කැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. කැපැල්පත් භාරගන්නා අවසාන දිනය අගෝස්තු මස 25 දය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. තෑගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.




## ▶ හරහට

1. නව අරහාදී බුදු ගුණවලට අයත්ය.
4. පස් ආකාර ධ්‍යාන අංගවලින් එකකි.
6. ගොවිතැන් කරන කාල නාමයකි.
9. මෙය නිවනට මග අහුරයි.
10. රුසියාවේ අපවත් වූ විචිත්‍ර ධර්ම දේශකයාණන් වහන්සේ.
11. කොළ පැහැයට සමාන පදයකි.
15. අලුත් අවුරුදු සමය හඟවන පක්ෂියා.
16. ආලෝකය ගෙන දෙයි.

## ▼ පහළට

2. මෙය අසාර වූ දෙයක් ලෙසට බුදු දහමේ ඉගැන්වේ.
3. සමහර ජලාශයන් මේ නමින්ද හැඳින්වේ.
5. මෙය ගොනා පසුපස එන කරත්තය මෙන් තමා පසුපස ලුහු බඳී.
7. දන් දීමෙන් ලැබෙන ආනිසංසයකි.
8. විහා අත්හල යුතුය.
12. මාර දූවරු තිදෙනාගෙන් කෙනෙකි.
13. අටමහා කුසල් පුරාවලින් එකකි.
14. පංචකාම සම්පත්තිවලට අයත්ය.

**ප්‍රහේලිකා අංක 77 ජයග්‍රහණය කළ වාසනාවන්තයෝ**

- ටී.බී. වනසිංහ
  නො. 30/16, පාරම්කුලගම මාවත, මහනුවර.
- සෝමලී ප්‍රනාන්දු
  නො. 506 පණ්ඩුකාභයපුර, අනුරාධපුරය
- රේණුකා මීගහකුඹුර
  නො. 153, කන්තේ පන්දිය, මාතලේ

## ඔබත් දළදා වරුණට ලියන්න

දළදා වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන ප්‍රවෘත්ති සඟරාවකි. වසර හතරකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඩුල්ලක් බැඳී සිටින අතර ශිෂ්‍ය පැවිදි ගිහි අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරන්තර සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ ප්‍රකාශනයන් පළවන සියලුම ලිපි, රචනා ඒ ඒ කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් වන්නේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගාව, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

## දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සොභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාහු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට වාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොගැළපෙන බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙදෙනෙක් වුවද ඔබ වඩා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැසිරීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් මිසක්, රට භාර ගන්නට සිටිනා ඔබ පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"ද්වේෂ රහිත වූ යමෙක් බැණීම් ගැසීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

# පස් පව් අතරින් වැඩිපුරම සිදුවන පව ගැනයි මේ

### පන්සිල් කියන්නේ චාරිත්‍ර ශීලයක්...!

පන්සිල් කියන්නේ පුද්ගලයෙකුගේ, පවුලක, ආයතනයක, ප්‍රජාවක, සමාජයක වගේම සමස්ත ජාතියේම යහපැවැත්මට ඉවහල් වන උතුම් චාරිත්‍ර ධර්ම සමූහයක්. ඕනෑම සමාජයක යහපැවැත්ම රඳා පවතින්නේ ඒ සමාජයේ පවතින චාරිත්‍ර වාරිත්‍ර මතයි. චාරිත්‍ර කියන්නේ පිළිපැදිය යුතු දේවල්. වාරිත්‍ර කියන්නේ වැළකිය යුතු දේවල්. ඒ අනුව සතුන් නොමැරීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීම, බොරු නොකීම, මත්පැන් නොබීම, කියන්නේ වාරිත්‍ර ධර්ම බව ඔබටත් පැහැදිලි වෙනවා ඇති. නමුත් මේ විදියට පස් පව්වලින් වැළකී සිටීමෙන් විතරක් බෞද්ධකම ආරක්ෂා වෙන්නේ නැහැ. ඒ සඳහා පිළිපැදිය යුතු චාරිත්‍රමය සහ සදාචාරාත්මක කරුණු රාශියකුත් තිබෙනවා. එහෙම නැත්නම් ඇස් නොපෙනෙන, කන් නෑසෙන, තමන්ගේ වැඩ කටයුතුවත් කරකියා ගැනීමට බැරි තරමට ශරීරය ඊත්පල රෝගී සහ මහලු පුද්ගලයන් මේ ලෝකයේ සිටින හොඳම බෞද්ධයන් විය යුතුයිනේ.

සාමාන්‍ය ජීවිතයේදී බොහෝ දෙනෙකු අතින් විවිධ ආකාරවලින් පන්සිල් කැඩෙනවා. සමහර විට සුළු වශයෙන්, තවත් සමහර විට බරපතළ වශයෙන්. ඒ ආකාරයට විවිධ අයුරින් පන්සිල් කැඩෙන නිසා තමයි පන්සිල් රකින්න කියලා කියන්න සිද්ධ වෙන්නේ. දන් අපි කියනවා හේන් රකිනවා කියලා. අපි මොකටද හේන් රකින්නේ? විවිධ වන සතුන්ගෙන් හේන පාළු වෙලා යන නිසා. පන්සිල් කියන්නෙත් අන්න ඒ වගේ බොහොම අමාරුවෙන් රැකගත යුතු දෙයක්. හැබැයි ඔතන තියාගන්න ඒ හේන නිකම් රැකගෙන ඉඳලා හරියන්නෙත් නැහැ. ඒකේ හොඳම සරුසාරෙට බව භෝග වගා කරගන්නත් ඕනේ. පින් ඒ වගේම කුසල ධර්ම කියන්නෙත් ඒ බව භෝගවලට.

### පන්සිල් කඩනවාද? කැඩෙනවාද?


මිනිසුන් පන්සිල් කඩනවා. ඒත් පන්සිල් අතරින් හැම ශීලයක්ම එක විදිහට කඩන්නේ නැහැ. සමහරු පහම කඩනවා, තව සමහරු හතරක්, තුනක්, දෙකක් ආදී වශයෙන් කඩනවා. නමුත් අපේ සමාජයේ අතිවිශාල පිරිසක් වැඩිපුරම කඩන එක සිල් පදයකුත් තියෙනවා. ඒ තමයි මුසාවාද වේරමණී. ඒ කියන්නේ බොරුවෙන් වැළකීම පිළිබඳ ශික්ෂාපදය. ජීවත් වෙන ඕනෑම කෙනෙකු වෙතින් යම් යම් හේතු මත මේ සිල් පදේ කැඩෙන්න පුළුවන්. නමුත් සමහරු කියනවා අනේ හාමුදුරුවනේ, මම නම් ඉතාම හොඳට පන්සිල් රකිනවා. ඔය ඉඳලා හිටලා බොරුවක් කියැවෙන එක තමයි තියෙන පුංචි වැරැද්ද කියලා. බලන්න එතැනදී කියන්නෙත් බොරු කියනවා කියලා නොවෙයි බොරු කියැවෙනවා කියලා. කියනවා කියන්නේ අචේතනාත්මකව කිරීම. එතකොට කවුරු හරි බොරු කියන්නේ චේතනාත්මකවද? අචේතනාත්මකවද? කවුරු හරි කියනවා නම් මං බොරු කියන්නේ අචේතනාත්මකව කියලා ඒක වෙනම බොරුවක්.



ඒ විදිහට අවේතනාත්මකව බොරු කියැවෙන සුළු පිරිසකුත් අප අතරේ ඉන්නවා. ඒ එක එක මානසික රෝගවලින් පෙළෙන අය. තමන් නොදැනුවත්වම අසේ බොරු කියැවෙන මානසික රෝගයකුත් තියෙනවා.

"ඒක ධම්මං අතීතස්ස
මුසාවාදිස්ස ජන්තුනෝ
විතිණ්ණ පරලෝකස්ස
නත්ථි පාපං අකාරියං"

ඒ කියන්නේ ඇත්ත කියන උතුම් ධර්මය පැත්තකට දමා පරලොව ගැන විශ්වාසයක් නැතුව බොරු කියන්නාට නොකළ හැකි පාපයක් නැත කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඒ වගේම මේ බොරුව අනික් සිල්පද හතර එක්කම සම්බන්ධයි. මහත්තයා කොහේ හරි විහිත් සුන්දැනි සිල්පදේ කඩලා ගෙදර ආවම නෝනා අහනවා අද ඔයා කොහේද ගියේ කියලා. එතකොට මහත්තයාට ඇත්ත කියන්න පුළුවන්ද? කවුරු හරි ගෙදරකින් මොකක් හරි බඩුවක් මුට්ටුවක් හොරකම් කරගෙන යනවා. එතකොට මගදි කොහේද ඒවා හම්බ වුණේ කියලා කවුරු හරි ඇහුවොත් ඒ මිනුස්සයට පුළුවන්ද ඇත්ත කියන්න. ඒ නිසා බොරු කීම නතර කරගන්න පුළුවන් නම් අනික් සිල්පදත් ඉබේම ආරක්ෂා වෙනවා. අපේ සමාජයේ පිරිසක් ඉන්නවා කටේ, නොලේ නොග ඩි බොරු කියන. ඒ වගේම බොරු කීම විනෝදයක් කරගත්තු පිරිසකුත් ඉන්නවා. නමුත් මොන හේතුවක් මත කවුරු මොන විදිහේ බොරුවක් කිව්වත් ඒ පුද්ගලයාගේ දෙලොව වශයෙන් පිරිහීම නතර කරන්න කාටවත් බැහැ. ඔය අතරේ සමහරු කියනවා අද බොරුව තමයි ජයගන්නේ. අද ඇත්තට, යුක්තියට කිසිම තැනක් නෑ කියලා. නමුත් ඒක සැබෑ ජයක් නෙවෙයි. තාවකාලික ජයක් වගේ පෙනෙන දෙයක්. ඉඩෝර කාලවලදී කැලයේ ඈතින් අව් රශ්මියට වතුරක් වගේ තැලියන දෙයක් පේනවා. ඒකට කියන්නේ මිරිඟුව. මිරිඟු දිය කියලා. මේ මිරිඟුවට වතුරක් කියලා රැවටෙන, පිපාසයෙන් පීඩිත වුණු මුවෝ මැරිලා වැටෙනකම් ඒ පැත්තට දුවනවා කියලා ජන විශ්වාසයක් තියෙනවා. බොරුව කියන්නෙත් අන්න ඒ වගේ මිරිඟු දියක් විතරයි.



## මේක බොරුව රජයන සමාජයක්

අතීතයට සාපේක්ෂව වර්තමානයේ බොරුව වැඩිපුර සමාජගත වීමක් දකින්නට පුළුවන්. ඒකට හේතුව තමයි බොරු කීමට ඇති බිය සහ ලජ්ජාව තුරන් වීම. මේකට ප්‍රධාන වශයෙන් රටේ පාලකයන් පවා වගකිව යුතුයි. අපි හිතමු කිසියම් රටක නීති විරෝධී කටයුතුවලට නොනිල මට්ටමින් රාජ්‍යානුග්‍රහය ලැබෙනවා. අපරාධකාරයන්ට නිදැල්ලේ හැසිරෙන්නත් පාලකයන් ඉඩ දෙනවා. ඒක රටේ වැසියන්ට හොඳටම වැටහෙනවා. ඔය අතරේ රටේ පාලකයන් ජනතාව ඉදිරියට ඇවිත් කියනවා මේ රටේ නීතියේ ආධිපත්‍යය බිඳ වැටෙන්න අපි කිසිවිටක ඉඩ තියන්නේ නැහැ. නීතිය කාටත් පොදු විය යුතුයි. නීතියට අත තියන්න කාටවත් ඉඩ දෙන්නේ නැහැ කියලා. රටේ පාලකයන් ප්‍රසිද්ධියේ ඒ වගේ බොරුවක් කියන කොට රටවැසියන් ඒක ආදර්ශයට ගැනීම වළක්වන්න බැහැ. මේ සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ අපූරු උපමා කතාවක් දක්වනවා. ගංගාවක් තරණය කරන ගව රැළක නායක ගවයා ඒ ගඟ හරහා කෙළින්ම පීනාගෙන ගියොත් අනික් ගවයනුත් නායක ගවයා අනුව කෙළින්ම පීනාගෙන යනවා. එහෙම නැතුව ගඟ තරණය කරන නායක ගවයා ගඟට බැහැලා ඒ මේ අතට හැරි හැරී වක්‍ර ආකාරයකට පීනන්න පටන් ගත්තොත් අනික් ගවයොත් ඒ ඔස්සේ වැරදි විදියට පීනනවා. මේ කතන්දරය අදත් අපිට අත්දකින්නට ලැබෙනවාද, නැද්ද කියන එක බුද්ධිමත්ව හිතලා බලන්න.

## දෙගුරුන්ගෙන් බොරු හුරුවන දරුවෝ

ළමයි බොරු කියන්නේ පෙළඹෙන්නේ ඇයි? මේ ගැන නවීන මනෝ විද්‍යාඥයන් විවිධාකාර පරීක්ෂණ පවත්වලා තියෙනවා. ඒවායින් ලැබුණු එක් වැදගත් නිගමනයක් තමයි හුඟක් දරුවන් බොරු කියන්න පෙළඹෙන්නේ තමන්ගේ වැඩිහිටියන් ආදර්ශයට ගනිමින් බව. මේක මට හිතෙන්නේ අපේ කාන්තාවෝ හුඟ දෙනෙක් දන්න තත්ත්වයක්. පහුගිය කාලේ අපි දන්න එක පවුලක් දවස් කීපෙකට ගමක් පිටවෙලා හිටියා. ඒ පවුලේ කාන්තාව තමන්ගේ දරුවාව ඉස්කෝලේ එක්ක යනකොට ඉස්සරහට මුණ ගැහුණු ගුරුතුමියක් ඇහුවා පහුගිය විකේ ඔයාලා කොහේද ගියේ කියලා. ඒ ගුරුතුමියත් ඒ ගමේම කෙනෙක්. එතකොට මේ අම්මා ගත් කටටම කිව්වා අපි පහුගිය වීකේ කොළඹ ගියා කියලා. එතකොටම ඒ කාන්තාවගේ පුංචි පුතා ගත් කටටම අර කාන්තාවගෙන් අහනවා ඇයි අම්මේ බොරු කියන්නේ? අපි ගියේ කුරුණෑගලනේ කියලා. කොහොමත් හරි මේ වගේ අහඹු සිද්ධියක් හැරුණාම සියයට අනූ නවයක්ම වෙන්නේ දරුවනුත් දෙමව්පියන් ආදර්ශයට ගනිමින් බොරුවට යොමුවීම. මේක පුද්ගලයාගේ සිට ජාතිය දක්වාම පරිහානියට පත්කරවන තත්ත්වයක්.

## සැබෑ සංවර්ධනයට නම් බොරුව ඉවත් කළ යුතුයි

මේ තත්ත්වය යටතේ පුද්ගල වශයෙන් අපි ඒ වගේම අපේ පවුල්, ආයතන ඇතුළු මේ සියලුම දේවල් තුළින් බොරුව, අසත්‍යය යටපත් කොට සත්‍යය ඉස්මතු කළ යුතුයි. එසේ කළ හැකි නම් ඒ තුළින් ඔබගේ ජීවිත, පවුල ඇතුළු සමස්ත සමාජයම සුඛිත මුදිත වීමෙත්, ඒ ඔස්සේ පස් පව් දස අකුසලවලින් දුරුවුණු සැබෑ සංවර්ධිත රටක්, ජාතියක් වශයෙන් විරාජමාන වී උතුම් බුදු සසුන තව චිරාත් කාලයක් රැක ගැනීමට අප කාටත් හැකියාව ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.

ඇහැටුවැව, දිවුල්ලගේ පුරාණ දිමුලාගල රාජමහා විහාරාධිපති
පූජ්‍ය ගලගිරියාවේ සිරිරතන හිමි